

# වාර්ෂික වාර්තාව 2012

ජාතික රක්ෂණ භාර අරමුදල

# පටුන

| | පිටු අංකය |
|---|---|
| 01. සමායතනික දර්ශනය | 3 |
| 02. ඉලක්ක **සහ අරමුණු** | 7 |
| 03. ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2012 | 10 |
| 04. සභාපතිගේ සමාලෝචනය | 12 |
| 05. **කළමනාකරණ** විශ්ලේෂණය සහ සාකච්ඡාව | 14 |
| 06. තිරසාර වාර්තාකරණය | 33 |
| 07. **පාලන වාර්තාකරණය -** ව්‍යවසාය **පාලනය** | 37 |
| 08. පාලන **වාර්තාකරණය සහ ව්‍යාපාර** අවදානම් කළමනාකරණය | 45 |
| 09. මූල්‍ය ප්‍රකාශ 2012 | 50 |
| 10. විගණන වාර්තාව | 63 |
| 11. සත් වසරක අවලෝකනය | 74 |
| 12. සමායතනික තොරතුරු | 77 |

# 01. සමායතනික දර්ශනය



# දැක්ම

## ආරක්ෂාව ඇවැසි සියළු අංශයන්ට රැකවරණය හා ආරක්ෂණ ජාලයක්



# මෙහෙවර

- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියළුම අංශයන් අරබයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම

- වෙනස් වෙමින් පවත්නා අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවධානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීම් හා වෙනත් වැඩපිළිවෙලවල් තුළින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම.

- දේශීය රක්ෂණ වෙළෙඳපොලට අතිරේක ශක්නුතාව සලසාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම

තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීම.

# සමායතනික හර පද්ධති




- විශ්වාසනීය බව
- අවංකත්වය
- වගකීම
- මූල්‍ය ස්ථාවරත්වය
- වෘත්තීය කළමනාකරණය

## 02. ඉලක්ක සහ අරමුණු

- සියළුම සමාජයීය කොටස් ආවරණය කෙරෙන අපේක්ෂිත ඉලක්කගත කණ්ඩායම්වල යහසාධනය අරබයා රක්ෂණ ක්‍රම ක්‍රියාවට නංවාලීම

- ප්‍රතිරක්ෂණ වෙළෙඳපොළෙහි යටත් පිරිසෙයින් සියයට 50ක් ග්‍රහණය කරගනු පිණිස ප්‍රතිරක්ෂණ ක්‍රමයක් සැලසුම්කොට ක්‍රියාවට නංවාලීම

- ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම රක්ෂණ ක්‍රම ස්වයංකරණය කිරීම

- සියලුම ප්‍රතිලාභීනට අතිශයින් කාර්යක්ෂම සේවාවක් සලසාලනු පිණිස මානව සම්පත් සංවර්ධනය කරලීම්

- ඉදිරි පස් වසරක කාලසීමාව තුළදී පාර්ශවකරුවන්ට උපරිම ප්‍රතිලාභයක් අත්කර දීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ආයෝජන ඵලදායීව කළමනාකරණය කරලීම්

- රක්ෂණ ක්‍රමයන්ට සහභාගිවන්නන් දැනුවත් කරලීමේ අධ්‍යාපන වැඩ සටහන් මාර්ගයෙන් ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කරලීම්

- **ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉදිරි මෙහෙයුම් කටයුතු පහසු කරලීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය කරලීම්**

- **අවදානම් කළමනාකරණ ඒකකයක් පිහිටුවාලීම සහ ක්ෂේත්‍ර අධ්‍යයනයක් පැවැත්වීම සඳහා සිය ඉදිරි රක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදලට මග පෙන්වීම්**

# 3. ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාජික මණ්ඩලය - 2012



ඩී. විදානගමාච්චි මහතා

සභාපති



ජේ. දඩල්ලගේ මහතා

(මණ්ඩල සාමාජික)



වෛද්‍ය ලෝහිත සමරවික්‍රම මහතා

(මණ්ඩල සාමාජික)



ඩබ්.එච්. පියදාස මහතා

(මණ්ඩල සාමාජික )



එන්. කුලසේකර මහතා

(මණ්ඩල සාමාජික)



ඒ.කේ. සෙනෙවිරත්න මහතා

(මණ්ඩල සාමාජික)

# 04. සභාපතිගේ සමාලෝචනය

**වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම - 2012**

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2012 වසර උදෙසා වන වාර්ෂික වාර්තාව ජාරභා අරමුදල වෙනුවෙන් ඉදිරිපත් කිරීමට ලැබීම මගේ භාග්‍යයක් කොට සලකමි.

2012 වසර තුළ ජාරභාඅ විසින් උපයන ලද ශුද්ධ වාරික ආදායම රුපියල් බිලියන 3.02 වන අතර එය 2011 වසරේ ආදායම වූ රුපියල් බිලියන 2.5 සමග සසඳන විට මද වර්ධනයකි. 2012 ශුද්ධ ආදායම රුපියල් බිලියන 2.1 වන අතර එය 2011 වසරේ පැවති ශුද්ධ ආදායම වන රුපියල් බිලියන 2.2 මද අඩුවීමක් දක්වයි. ජාරභා අරමුදලේ මූල්‍ය කාර්යසාධනය කාර්යසාධන සමාලෝචන කොටසෙහි විස්තරාත්මකව දක්වා ඇත. ජාරභා අරමුදල අඛණ්ඩව අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා පාර්ලිමේන්තු සභිකයන් උදෙසා වන රක්ෂණ යෝජනා ක්‍රමය වැනි සමාජ ප්‍රගතිය අරමුණුකරගත් රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කරයි. 2006 අංක 28 දරන රක්ෂණ භාර අරමුදල් පනතේ 2 වන වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය ප්‍රකාරව භාරගන්නා ලද වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ආවරණ, සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා රක්ෂණ ප්‍රතිපත්ති නිකුත් කිරීම සම්බන්ධයෙන් වන විශේෂ ගිණුම් කළමනාකරණය සහ රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂණ සැලසුම් මත 20% ක අනිවාර්ය පවරා ගැනීමට භාර ගැනීම සමාලෝචිත වර්ෂය තුළ ඇතිකර ගන්නා ලද කාර්ය සාධනය වෙනුවෙන් ප්‍රධාන වශයෙන් දායකවී ඇත.

ඊට අමතරව 2012 වසරේදී 20%ක්වූ අනිවාර්ය පැවරුම 30% දක්වා වැඩිකිරීමටද අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය සුභවාදී වෙනසකට ලක් කිරීමටද උපායමාර්ගික ප්‍රවේශයන් කිහිපයක්ම ඇති කරන ලදී.

**කෘතඥතා පූර්වක ස්තූතිය**

මම මුදල් විෂය භාර අමාත්‍යවරයාට, අවශ්‍ය උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය ලබාදුන් භාණ්ඩාගාර ලේකම්තුමාට මණ්ඩලය වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන්ට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

වටිනා දායකත්වයක් ලබාදුන් මණ්ඩලයේ සාමාජිකයන්ට මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. අප කෙරෙහි විශ්වාසය තැබූ අපගේ වටිනා සේවාදායකයන්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ට ස්තූතිය පුද කරමි.

අපගේ සේවකයන් අපගේ පදනම වේ. රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ සාර්ථකත්වය සඳහා වන ඉදිරියට යාම ඔවුන්ගේ කැපවීම මත පමණක් සිදුවේ. කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්ගේ මූලිකත්වය යටතේ කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලයට ස්වකීය කැපවීම වෙනුවෙන් මගේ කෘතඥපූර්වක ස්තූතිය මෙයින් පුද කරමි.

අ.කළේ / ඩී. විදානගමාච්චි

සභාපති

# 05. කළමනාකරණ විශ්ලේෂණය සහ සාකච්ඡාව

# 5.1 පොදු පාරිසරික සමාලෝචනය

**රක්ෂණ කර්මාන්තය සමාලෝචනය**


2012 වර්ෂය තුළ මෙහෙයුම් පිණිස රක්ෂණ සමාගම් 21 ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි ලියාපදිංචිව සිටී. සමස්තයක් වශයෙන් ගත් කල රක්ෂණ අංශය මූල්‍ය අංශයේ මුළු වත්කම් වලින් 3%ක පමණ ප්‍රමාණයකට වගකියයි. කෙසේ වෙතත් දිගටම කර්මාන්තයේ අධිකාරීත්වය මහා පරිමාණ රක්ෂණ ආයතන කිහිපයක් විසින් පවත්වා ගනු ලබන අතර සමස්ත රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් වලින් 60% ට අධික ප්‍රමාණයක් සමාගම් දෙකක් සතුවේ. ඉහල කල්බදු අනුපාතයන් හා සම්බන්ධිතව වාහන සඳහා වන ආනයනික බදු දැඩි සේ ඉහල දැමීමත් සමග වාහන ආනයන පහල බැසීම රක්ෂණ වෙළඳපලට අයහපත් බලපෑම් ඇති කර තිබේ.කොටස් වෙළඳපලේ දුර්වල කාර්යසාධනය හා ඉහල පොලී අනුපාත හේතුවෙන් නිවාස ණය ගැනීමේ වර්ධනයේ ඇතිවූ පහත බැසීම මත ඒකක-සම්බන්ධිත ජීවිත රක්ෂණ නිපැයුම්හී ඉල්ලුම පහත වැටීම මගින්ද ඇති කරන ලද්දේ නිශේධාත්මක බලපෑමකි. කෙසේවතුදු සාර්ව ආර්ථික තත්වයන්හී ක්‍රමාණුකූල වර්ධනයත් සමග ඉදිරි වසර වලදී වඩා යහපත් කාර්ය සාධනයක් ඇතිවන ලකුණු සමගින් 2012 වසරේ ජීවිත රක්ෂණ නොවන වෙළඳ පල 14.65%කින් වර්ධනය වී ඇති අතර ජීවිත රක්ෂණ වෙළඳපලද 6.56%ක වර්ධනයක් ලබා ඇත. රක්ෂණ ක්‍රියාකාරීත්වය මනිනා රක්ෂණ ව්‍යාප්තිය අනෙකුත් ආසියානු රටවල් හා සසඳන විට ශ්‍රී ලංකා ආර්ථිකයට අදාලව පහල මට්ටමක පවතී. සමස්ත වාරික අනුව දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස මනිනු ලබන රක්ෂණ ව්‍යාප්තිය හා ජනගහනයට මුළු වාරික අදාල වන්නාවූ රක්ෂණ ඝනත්වය සාපේක්ෂ වශයෙන් ගත් කල පිළිවෙලින් 1.15% හා රුපියල් 4,287 වැනි නොවැදගත් මට්ටමක පවතී.

**ජාතික රක්ෂණ භාර අරමුදලෙහි කාර්යභාරය**

2012 වසර තුළදී ජාරභා අරමුදල රටේ තිරසර සංවර්ධනය සහතික කිරීම උදෙසා දායකත්වය සපයා ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල මේ දායකත්වය සපයන ලද්දේ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, සහ ප්‍ර තිරක්ෂණ වැනි විවධ රක්ෂණාවරණයන් මගිනි. රජයේ ශ්‍රම බලකාය සඳහා නිර්මාණය කරන ලද අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් වලට සහ විදේශ විනිමය රටට ගෙනෙනා විදෙස් ශ්‍රමික ප්‍රජාව පිලිබඳව වග කියන අතර මෙන්ම ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රම මගින් ආර්ථික අවදානම් වලට උරදෙයි.


# 5.2.1 සප්ත වාර්ෂික මූල්‍ය සමාලෝචනය

වගුව- 5.01: කාර්ය මණ්ඩලාශ්‍රිත පිරිවැයේ පැවති ප්‍රවණතාව





කාර්ය මණ්ඩලාශ්‍රිත වියදම් රටාවෙහි වසර හතකට වැඩි කාලයක අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරන අතර ඉහල බඳවා ගැනීම් සංඛ්‍යාව හේතුවෙන් 2012 දී වර්ධනය මදක් ඉහල මට්ටමක පවතී. එය රුපියල් මිලියන 72 ලෙස වාර්තාවන අතරඉහලම අගය එය වේ.නව සේවකයන් බඳවා ගැනීම මෙන්ම වැටුප් හා වේතන වැඩිකිරීමද මීට හේතුවේ.

වගුව- 5.02: ශුද්ධ ලාභය සම්බන්ධයෙන් පසුගිය සමයේ ප්‍රවණතාව




2009 දක්වා වසර හතරකට අධික කාලයක් ශුද්ධ ලාභයේ වර්ධන ප්‍රවණතාවක් පැවති අතර ත්‍රස්තවාදී ක්‍රියා වෙනුවෙන් වූ රක්ෂණාවරන වල ඉල්ලුමේ පහත වැටීම හේතුවෙන් 2010 දී එය සැලකිය යුතු අඩුවීමක් දක්වයි. 2010 හා සසඳන විට 2011 දී එය 7%කින් මද අඩුවීමක් දක්වයි.2010-2012 කාලයේ එහි මද අඩුවීමක් දක්වයි.

වගුව- 5.03:සමුච්චිත අරමුදලේ පසුගිය සමයේ ප්‍රවණතාව




2010 තෙක් සමුච්චිත අරමුදල රුපියල් මිලියන 9965 දක්වා වැඩිවූ නමුදු 2010 හා සසඳන විට 2011 දී 12%ක අඩුවීමක් පෙන්වයි. තවද 2012 වසර අවසානය වන විට අරමුදල රුපියල් මිලියන 5913 දක්වා පහත බසී. අරමුදලට මාරුකරන ලද රදවාගත් ලාභ මත 2012 වසර සඳහා වාර්ෂික ශුද්ධ ලාභයමත බද්දක් පැනවීම හේතුවෙන් සමුච්චිත අරමුදල පහත වැටේ

# මූල්‍ය කාර්යසාධනය – 2012

## වාරික ආදායම කාණ්ඩය අනුව

වගුව-5.01අ: කාණ්ඩ අනුව වාරික ආදායමේ වර්ගීකරණය

| වර්ගය | 2012 රුපියල්. | 2011 රුපියල්. | 2010 රුපියල්. |
|---|---|---|---|
| **01.ශුද්ධ වාරික ආදායම් ඉපයුම** | | | |
| වාරික ආදායම –රජයේ වාහන | 206,595,378 | 215,199,457 | 237,386,267 |
| වාරික ආදායම – ප්‍රතිරක්ෂණ | 463,610,216 | 198,551,912 | 296,078,296 |
| වාරික ආදායම – පාර්ලිමේන්තු සභිකයන් | 10,000,000 | 10,000,000 | 10,000,000 |
| වාරික ආදායම – විදේශ රැකියා | 54,577,250 | 208,799,952 | 231,968,216 |
| වාරික ආදායම – මෝටර් වාහන නොවන | 104,047,985 | 170,876,837 | 149,796,387 |
| වාරික ආදායම - SRCCTF | 2,281,210,351 | 2,006,556,886 | 1,874,425,103 |
| වාරික ආපසු ගෙවීම් | (34,291) | (26,080) | (4,194,863) |
| දළ ලිඛිත වාරික | 3,120,006,892 | 2,809,958,964 | 2,795,459,406 |
| ප්‍රතිරක්ෂණ වාරික | (1,304,600) | (179,367,937) | (132,180,421) |
| **ශුද්ධ ලිඛිත වාරික** | 3,118,702,292 | 2,630,591,027 | 2,663,278,785 |
| ආසන්න වාරික සඳහා සංචිතයන්හී ශුද්ධ වෙනස | (95,954,471) | (141,879,032) | 225,260,471 |
| ශුද්ධ වාරික ආදායම් | 3,022,747,821 | 2,448,711,994 | 2,888,539,456 |

වගුව5.01ආ: අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය සඳහා දායකත්වයන්

| මූලාශ්‍රය | 2012 රුපියල්. | 2011 රුපියල්. | 2010 රුපියල්. |
|---|---|---|---|
| රජයේ සේවකයන් ගේ දායක වීම | 588,435,521 | 623,424,037 | 595,140,400 |
| රජයේ දායකත්වය | 275,000,000 | 494,299,000 | 442,790,000 |
| **එකතුව** | 863,435,521 | 1,117,723,037 | 1,037,930,400 |

වගුව-5.02: වාරික ආදායම සහ දායක මුදල් ආදායමේ ප්‍රවණතා විශ්ලේෂණය

සියළු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|
| දායක මුදල් ආදායම | | | | | | |
| අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය | **925,340,682** | **1,075,339,833** | **1,013,898,510** | **1,037,930,400** | **1,117,653,037** | **863,435,521** |
| වාරික ආදායම මෝටර් වාහන | | 130,018,979 | 244,352,905 | 237,386,267 | 215,199,457 | 206,595,378 |
| වාරික ආදායම ප්‍රතිරක්ෂණ | | 341,170,103 | 473,434,837 | 296,078,296 | 198,551,912 | 463,610,216 |
| වාරික ආදායම සාමාන්‍ය රක්ෂණ මෝටර් වාහන නොවන | | 148,428,753 | 216,086,561 | 391,764,603 | 389,676,789 | 168,625,230 |
| දළ ලිඛිත වාරික වැව සිඅ හා තුකි | 2,178,012,010 | 2,317,492,759 | 2,420,345,104 | 1,874,425,103 | 2,006,556,886 | 2,281,210,354 |
| මුළු වාරික ආදායම | 3,103,352,692 | 4,012,450,427 | 4,368,117,917 | 3,837,584,669 | 3,927,638,081 | 3,983,476,699 |

වෛද්‍ය රක්ෂණ ක්‍රමයට සාමාජික දායකත්වය

යෝජනා ක්‍රමයේ සාමාජිකයකු වීම සඳහා හිමිකම ඇති රජයේ සේවකයෝ රුපියල් 75 බැගින් මාසිකව ගෙවමින් දායක වෙති. ආදායම පිලිගැනීම මුදල් පදනමිනි. වාර්ෂික ආදායම උච්චාවචනය වේ. නව බඳවා ගැනීම් හේතුවෙන් දායකත්වයන්හී ආන්තික වර්ධනයක් පැවතිය යුතුය.

# රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ සමාලෝචනය

2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ 2006 දී ජාතික රක්ෂණ භාර අරමුදල ස්ථාපිත කරන ලදී. එය ආරම්භ කිරීමත් සමගම සමාජයේ අවශ්‍යතා ඇති කොටස් වලට ප්‍රතිලාභ සැලසීම වෙනුවෙන් කැපවුන රක්ෂණ ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාරහා අරමුදලට බලය පවරන ලදී.

**1.රජයේ සේවකයන් පිණිස වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර)**

රජයේ නිලධාරීන්ගේ හිතසුව පිණිස 1997 දී ස්ථාපිත කරන ලද වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ලෙස හැඳින්වේ. එය මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ මාසිකව සාමාජිකයාගෙන් රුපියල් 11 බැගින් අය කරමිනි. පසුව 2005 වසරේ රජය විසින් ගන්නා ලද තීරණයකට අනුව විශ්‍රාම වැටුප් හිමි සියළු රාජ්‍ය සේවකයන් ගේ මාසික වැටුපෙන් රුපියල් 75 බැගින් රක්ෂණ ක්‍රමයට අය කරගන්නා ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලීකරණය කරන තෙක් රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගිනි. එහෙත් එය පුද්ගලීකරණය කිරීමත් සමගම 2006 ජනවාරි 1 සිට බල පැවැත්වෙන පරිදි රජය යෝජනා ක්‍රමය පවරා ගත් අතර ඉන්පසු එය ජාතික රක්ෂණ භාර අරමුදල යටගේ වෙනම රජයේ යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

**2.වර්ජන, කැරළි හා සිවිල් කෝලාහල සහ ත්‍රස්තවාදී අරමුදල**

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය තුළ වර්ජන, කැරළි හා සිවිල් කෝලාහල සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපලකට වන හානි/ පාඩු සහ/හෝ පුද්ගල සෞඛ්‍ය, හදිසි අනතුරු, ශාරීරික තුවාල වෙනුවෙන් ආවරණ පුළුල් කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව 1987 වසරේදී වර්ජන, කැරළි හා සිවිල් කෝලාහල සහ ත්‍රස්තවාදී අරමුදල පිහිටුවනු ලැබිණි. 1987 වසරේ සිට අරමුදල පරිපාලනය කරන ලද්දේ ජාතික රක්ෂණ සංස්ථාව විසිනි. ජාතික රක්ෂණ සංස්ථාවේ අනුප්‍රාප්තිකයා වන ජනශක්ති රක්ෂණ සමාගමෙන් පවරා ගනිමින් 2005.08.01 දින සිට අරමුදල පරිපාලනය කරන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසිනි. පසුව ජාරහා අරමුදල සමග සංස්ථාපිතව වර්ජන, කැරළි හා සිවිල් කෝලාහල සහ ත්‍රස්තවාදී අරමුදල යටතේ

පැවති සියළු මුදල් ජාරහා අරමුදල යටතට ගනු ලැබිණි. අනතුරුව එම මුදල් ජාරහා අරමුදල විසින් පවත්වා ගෙනයනු ලබන විශේෂ ගිණුමකට මාරු කරන ලදී.

**3.පාර්ලිමේන්තු සභිකයන් උදෙසා වන රක්ෂණ යෝජනා ක්‍රමය**

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පාර්ලිමේන්තු සභිකයන් උදෙසා රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යෝජනා ක්‍රමය යටතේ පාර්ලිමේන්තු සභිකයන් 225 දෙනා හටම ප්‍රතිලාභ සැලසේ. මෙකී යෝජනා ක්‍රමය මගින් පාර්ලිමේන්තු සභිකයන් හට පහත දැක්වෙන ප්‍රතිලාභ සැපයේ.

| | | |
|---|---|---|
| 1. | රු.මි. 5 දක්වා වන හසිසි අනතුරු රක්ෂණාවරන | |
| | හදිසි අනතුරු වලින් වන මරණ | රු. 5,000,000.00 |
| | හදිසි අනතුරු හේතුවෙන් වන පූර්ණ අකර්මණ්‍යතා | රු. 5,000,000.00 |
| 2. | වාර්ෂික වෛද්‍ය රක්ෂණාවරන | රු. 200,000.00 |

**4.ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සඳහා ප්‍රතිරක්ෂනාවරන**

ජාතික රක්ෂණ භාර අරමුදල් පණතේ විධිවිධාන අනුව යමින් ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකාවේ ප්‍රතිරක්ෂණ අවදානම භාරගති. ශ්‍රී ලංකාවේ පොදු රක්ෂණ සමාගම් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ මුළු ප්‍රමාණයෙන් 20% ලබා ගැනීම අනිවාර්යය වේ.ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2011 ඔක්තෝබර් අවසානය දක්වා මේ 20% ප්‍රතිපාදනය ප්‍රතිපැවරුම් වැඩසටහන යටතේ ප්‍රතිරක්ෂණය කරන ලදී.

**5.මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රම (රජය සතු වාහන සඳහා)**

රජයේ ආයතනයන්ට හිමි මෝටර් වාහන(මනාපය පරිදි) හා අර්ධ රාජ්‍ය ආයතනයන්ට හිමි වාහන (මනාපය පරිදි) වලට සිදුවිය හැකි හානි සහ පාඩු වෙනුවෙන් රක්ෂණය කරනු ලබන අතර හානිය රජය මගින් දරනු ලබයි. ආරම්භයේදී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රාජ්‍ය අංශයට මෝටර් වාහන රක්ෂණ පිරිනමනු ලැබූ අතර ඉන් අනතුරුව දැරිය හැකි වාරික යටතේ අදාල සේවා පුද්ගලික

අංශයටද පිරිනමන ලදී. එහි විස්තීර්ණ මෝටර් වාහන රක්ෂණය යටතේ ගින්නෙන්, සොරකම් වලින් සිදුවන හානි සහ තෙවන පාර්ශවයන්ට සිදුවන හානි(මරණ හා තුවාල) ආවරණය කරන අතරම ගංවතුර,වර්ජන,කැරළි, සිවිල් කෝලාහල හා ත්‍රස්තවාදී ක්‍රියා වැනි අතිරේක හානි සම්බන්ධයෙන් ආවරණ සැපයේ.

### 6. සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2009.08.20 දිනැතිව නිකුත් කරන ලද අංක 1615/20 ගැසට් නිවේදනය ප්‍රකාර ජාතික රක්ෂණ භාර අරමුදලට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ ගිනි රක්ෂණ ඔප්පු, නාවික රක්ෂණ ඔප්පු, කම්කරු වන්දි රක්ෂණ ඔප්පු සහ වෙනත් විවිධ රක්ෂණ ක්‍රමයන් පිරිනැමීමට බලය පවරා තිබේ.

# අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය



මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 12/2005 අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. විවාහක සේවක සාමාජිකයන්, ඔවුන්ගේ කලත්‍රයා හා දරුවන්(ඔවුන් අවිවාහක, රැකියා විරහිත හා වයස අවුරුදු 21 ට අඩු නම් පමණක්) හා අවිවාහක සේවකයන් වන කල සාමජික, දෙමව්පිය,(දෙමව්පියන්ගේ වයස අවුරුදු 70 අඩුනම් පමණක්)යන අයට ප්‍රතිලාභ සැලසිය හැකිවන සේ එය 2006 ජනවාරි 01 දින සිට ජාතික රක්ෂණ භාර අරමුදලේ විෂය පථය යටතට ගන්නා ලදී.

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය හඳුන්වාදෙන ලද්දේ රාජ්‍ය සේවක, පලාත් රාජ්‍ය සේවක හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් ගේ ජීවන තත්වය නගා සිටුවීමේ අදහස පෙරදැරිවය. ඒ අනුව කළමණාකරනය ඉදිරිපත් වන හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු වේගවත් කිරීම සඳහා හැකි තරම් ඉක්මනින් පියවර ගනියි.

හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම් කිරීම පිණිස ගෙවීම් ක්‍රියාවලිය වේගවත් කරනු වස් ඊ- කාඩ් පත් ක්‍රමය හඳුන්වා දීමෙන් පසු ජාතික රක්ෂණ භාර අරමුදල හිමිකම් සඳහා වන නව ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. සියළු අවශ්‍යතා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබනා හිමිකම් ඉල්ලීම් සඳහා ඊ- කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව වැඩ කරන දින තුනක් ඇතුළත ගෙවීම් සිදු කර තිබේ. මේ රක්ෂණ ක්‍රමය හඳුන්වා දීමෙන් පසු පහත ප්‍රතිලාභ කාණ්ඩයන් පිරිනමා තිබේ.

රෝහල් ගාස්තු වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ:

රෝහල් හා සාත්තු නිවාස ගාස්තු, වෛද්‍ය සහ ශල්‍ය වියදම්, වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සහ විශේෂඥ සේවා සහ විශේෂ සේවා, ගෘහ ප්‍රතිකාර යනාදිය වෙනුවෙන් ප්‍රතිලාභ මේ යටතේ සැපයේ.

1. උපැස් මිලට ගැනීම:

   මේ ක්‍රමය යටතේ සාමජිකයන් හට සෑම වසර තුනකට වරක් උපැස් යුවලක් මිලට ගැනීම පිණිස රුපියල් 3500 ක හිමිකම් ඉල්ලා සිටිය හැක. එය සාමාජිකයනට පිරිනමනුයේ තෙවසරකට පසුවය.

2. හෘද ශල්‍යකර්ම සඳහා වියදම් (හෘද රෝග):

මේ යෝජනා ක්‍රමය යටතේ සාමජිකයන්ට හෘද සැත්කමක වියදම් පියවා ගැනීම පිණිස රුපියල් 400,000 ක හිමිකම් ඉල්ලා සිටිය හැක.

3. "ණය සුරැකුම්" ණය වෙනුවෙන් වගකියන යෝජනා ක්‍රමය:

මාසික වැටුප මෙන් දස ගුණයක වටිනා කමෙන් යුත් ණය සුරැකුමක් පිරිනැමෙන අතර රෝගී තත්වයක්, පූර්ණ හෝ අර්ධ ආබාධිත තත්වයක් යටතේ ණයගැතියාට සිය දිවිය හෝ සාමාන්‍ය ඉපැයුම් මග අහිමිවෙයි නම් ණය මුදලේ ගෙවීමට ඉතිරිව ඇති කොටස මේ යටතේ ගෙවනු ලැබේ.

වගුව-5.03:අග්‍රහාර වෛද්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම් පිලිබඳ වර්ගීකරණය 2012 වසර **(සංඛ්‍යා වශයෙන්)**

| හිමිකම් ඉල්ලීම් වර්ගය | හිමිකම් ඉල්ලීම් මුළු ගණන | හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම් | හිමිකම් සඳහා ගෙවිය යුතු | ප්‍රතික්ෂේපිත හිමිකම් ඉල්ලීම් |
|---|---|---|---|---|
| මරණ | 1,992 | 1,886 | 39 | 67 |
| ආබාධිත තත්වයන් | 604 | 529 | 52 | 23 |
| දරු උපත් | 10,172 | 9,171 | 800 | 201 |
| පිළිකා | 356 | 320 | 22 | 14 |
| හෘද රෝග | 495 | 488 | 03 | 04 |
| උපැස් | 59,256 | 51,229 | 2,275 | 5,752 |
| අනෙකුත් රෝග සඳහා රජයේ රෝහල් ගාස්තු | 30,833 | 27,675 | 1,956 | 1,202 |
| අනෙකුත් රෝග සඳහා පෞද්ගලික රෝහල් ගාස්තු | 17,551 | 14,112 | 1,332 | 2,107 |
| වකුගඩු | 06 | 05 | 01 | - |
| අංශභාග | 07 | 05 | 01 | 01 |
| මුළු එකතුව | **121,272** | **105,420** | **6,481** | **9,371** |

# මෝටර් වාහන



පොදු මහා මාර්ගයන්හි ධාවනය කරනු ලබන සියලුම වාහන සඳහා අවම තරමින් තෙවන පාර්ශව රක්ෂණාවරනයක් හෝ ලබා ගත යුතුය යන්න ශ්‍රී ලංකා රජයේ මූලික නියමයකි. කෙසේ වෙතත් විස්තීර්ණ රක්ෂණාවරනයක් යටතේ මගීන්, ගොඩනැගිලි, වාහන යනාදියටද රක්ෂණ ප්‍රතිලාභ ලබාගත හැකිය.

ඒ අනුව වාහනයේ හිමිකරුට මෙන්ම තෙවන පාර්ශවයන්ටද උපරිම සේවා සපයමින් ජාතික රක්ෂණ භාර අරමුදලේ මෝටර් වාහන රක්ෂණය මගින් විස්තීර්ණ මෝටර් වාහන රක්ෂණයක් හදුන්වා දී ඇත.

## කා වෙනුවෙන්ද

2008 වසරේ සිට ජාරභා අරමුදල රජයේ සියළුම ආයතන ආවරණය කරමින් අවශ්‍ය සියළු ප්‍රතිලාභ සමගින් මෝටර් වාහන රක්ෂණාවරන පිරිනමයි. එය රජයේ ආයතන වලට අනිවාර්ය වේ.

2009.09.01 දින තවත් පියවරක් ඉදිරියට තබමින් රජයේ මෙන්ම පෞද්ගලික අංශයටද හැකි අවම කාලය තුළ හිමිකම් සඳහා ගෙවීම් කරමින් උපරිම සේවා සහතික කර විස්තීර්ණ ප්‍රතිලාභ සැපයීම අරමුණු කර පුද්ගලික වාහනද රක්ෂණය කරමින් අපේ සේවා පුළුල් කර තිබේ. කෙසේ වෙතත් 2012 වසර තුළ ජාතික රක්ෂණ භාර අරමුදල සිය ව්‍යාපාරික කටයුතු රාජ්‍ය අංශයට පමණක් සීමා කර තිබේ.

## ප්‍රතිලාභ

සාමාන්‍ය විස්තීර්ණ ආවරනය මගින් සියළු ආකාරයේ අන්තරායන්ට ආවරණ නොසැපයේ. අතිරේක වාර්කයක් ගෙවීම මගින් පහත සඳහන් අන්තරායන්ට ආවරණ ලබා ගැනීමේ විකල්පය වාහන හිමිකරු සතුවේ.

| ජාරහා අරමුදල පිරිනමන ආවරණයන් | ජාරහා අරමුදල පිරිනමන ආවරණයන් |
|---|---|
| තෙවන පාර්ශව දේපල හානි ආවරණය | පුහප්‍ර - රියදුරු /මගී- වැකෑ හා සි අරගල සඳහා ආවරණ (පු ආ) |
| පුහප්‍ර - රියදුරු/මගී ආවරණ | පුහප්‍ර - රියදුරු /මගී -ත්‍රස්ත ආවරණ(පුආ) |
| බඳු නිදහස් පැටවුම් ආවරණය | පුහප්‍ර - රියදුරු /සහායක / උපකාරක - වැකෑ හා සි අරගල සඳහා ආවරණ (CMV) |
| කුලියට ගැනීම් ආවරණය | පුහප්‍ර රියදුරු/සහායක/උපකාරක - ත්‍රස්ත ආවරණ (CMV) |
| වායු බෑග් ආවරණය | පුහප්‍ර මගී - වැකෑ හා සි අරගල සඳහා ආවරණ (CMV) |
| ඇදගෙන යාමේ ගාස්තු ආවරණය | පුහප්‍ර මගී - ත්‍රස්ත ආවරණ (CMV) |
| වින්ඩ්ස්ක්‍රීන් ආවරණය | පුහප්‍ර සේවක/පදවන්නා - වැකෑ හා සි අරගල සඳහා ආවරණ (MC) |
| රියපැදවීම පුහුණු කරන රියදුරු ආවරණය | පුහප්‍ර සේවක/පදවන්නා - ත්‍රස්ත ආවරණ (MC) |
| WCI for රියදුරු/සහායක/උපකාරක ආවරණ | රියදුරු/සහායක/රිය සහායක වෙනුවෙන් පුහප්‍ර |
| මගී රක්ෂණාවරන සඳහා නෛතික වගකීම | රියපැදවීම පුහුණු කරන රියදුරු ආවරණය |
| පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ ආවරණය-සේවා/පදවන්නා। | ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ |
| පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ ආවරණය-සේවා/පදවන්නා। | ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ - වැකෑ හා සි අරගල සඳහා ආවරණ |
| පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ ආවරණය-සේවා/පසු අසුනේ ගමන් කරන්නා | ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ - ත්‍රස්ත |
| ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ-අන්තරායකර නොවන භාණ්ඩ | ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ MCP |
| ප්‍රවාහණයේ ඇති භාණ්ඩ සඳහා ආවරණ-අන්තරායකර නොවන භාණ්ඩ | ගංවතුර ආවරණ |

වගුව-5.04:මෝටර් වාහන රක්ෂණ ප්‍රතිරක්ෂණය කිරීමේ රක්ෂණ ඔප්පු වර්ගීකරණය - 2012 වසර

**ගෙවන ලද මෝටර් රථ රක්ෂණ හිමිකම් වර්ගීකරණය**

| | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | එකතුව | | එකතුව | |
| වාහන පංතිය | හිමිකම් සංඛ්‍යාව | හිමිකම් මුදල (රුපියල් මිලියන) | හිමිකම් සංඛ්‍යාව | හිමිකම් මුදල (රුපියල් මිලියන) |
| ට්‍රැක්ටර් | 4 | 0.063 | 6 | 0.003 |
| පුද්ගලික මෝටර් රථ | 603 | 47.905 | 685 | 45.993 |
| යතුරු පැදි | 45 | 0.742 | 65 | 0.660 |
| මෝටර් කෝච් | 79 | 10.291 | 142 | 6.579 |
| ලෝරි රථ/ ඉඩම් වාහන | 100 | 14.099 | 104 | 3.900 |
| ලොරි ට්‍රේලර් | | | | |
| ද්විත්ව කාර්යය වාහන | 379 | 31.187 | 531 | 30.946 |
| වෑන් | 1 | 0.061 | | |
| ට්‍රේඩ් ප්ලේට් | | | | |
| ට්‍රේලර් | | | 1 | 0.024 |
| එකතුව | 1,211 | 104.351 | 1534 | 88.083 |

# සාමාන්‍ය රක්ෂණ



සියළු ආකාරයේ ගිනි,සමුද්‍ර සහ විවිධ රක්ෂණයන් ශ්‍රී ලංකා රජයේ මූලික අවශ්‍යතාවක් වේ.

## කා වෙනුවෙන්ද

රක්ෂණය අනිවාර්ය වන්නාවූ රජයේ ආයතනයන් හට සියළු ප්‍රතිලාභ සහිතව සාමාන්‍ය රක්ෂණාවරනයන්.

## ප්‍රතිලාභ

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පහත රක්ෂණාවරනයන් සපයනු ලබයි:

- ගිනි රක්ෂණය
- කොන්ත්‍රාත්කරුවන් උදෙසා සියළු අවදානම් රක්ෂණය
- විද්‍යුත් උපකරණ සඳහා වන රක්ෂණය
- සමුද්‍රු රක්ෂණය
- කම්කරු වන්දි රක්ෂණය
- පුද්ගල හදිසි අනතුරු රක්ෂණය
- සෞඛ්‍ය රක්ෂණය
- සංචාර රක්ෂණය

<u>වගුව-5.05: සාමාන්‍ය රක්ෂණ ඔප්පු වර්ගීකරණය</u>

| | 2012 | |
|---|---|---|
| **ඔප්පු කාණ්ඩය** | | **ඔප්පු සංඛ්‍යාව** |
| ගිනි | | 3 |
| සමුද්‍ර | | 110 |
| පුද්ගල හදිසි අනතුරු | | 3 |
| කම්කරු වන්දි රක්ෂණ | | 2 |
| ගෙවල් බිඳුම් | | 3 |
| මාර්ගස්ථ මුදල් | | 4 |
| විදුලි උපකරණ | | 7 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ සියළු අවදානම් | | 17 |
| යන්ත්‍ර හා පිරියත | | N/A |
| වෛද | | 15 |
| සංචාර | | 9 |
| **එකතුව** | | **173** |

<u>වගුව-5.06: වෛද්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම්-2012 වසර</u>

<u>වෛද්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම්- **2011 සහ 2012**</u>

| **කාණ්ඩය** | **2011** | **2012** |
|---|---|---|
| | **(රු. මිලියන)** | **(රු. මිලියන)** |
| හදිසි අනතුරු | 1.26 | 2.71 |
| දරු උපත් | 3.18 | 3.09 |
| බරපතල රෝගාබාධ | 0.00 | 2.31 |
| මරණ | 1.90 | 0.03 |
| රජයේ රෝහල් | 7.36 | 2.42 |
| බාහිර | 8.08 | 28.23 |
| පුද්ගලික රෝහල් | 31.79 | 72.07 |
| උපැස් | 4.32 | 8.21 |
| **එකතුව** | **69.78** | **119.08** |

# වැඩ වර්ජන,කැරළි කෝලාහල,සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා දක්වා ආවරණ ව්‍යාප්තිය



වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සඳහා වන ආවරණය ඇතුළු කිරීම සඳහා ව්‍යාප්ත කරන ලද රක්ෂණ ඔප්පු මත වන හිමිකම් ඉල්ලීම් ඉටු කිරීම සඳහා1987 වසරේදී එළඹි අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල අරමුදල පිහිටවනු ලැබූ අතර ජාතික රක්ෂණ සංස්ථාව විසින් පරිපාලනය කරන ලදී. සම්මත රක්ෂණ ඔප්පු මගින් ත්‍රස්තවාදී අවදානම රක්ෂණය නොකරන ලද හෙයින් හා1988/89 කලබල සමය තුළ ඉදිරිපත් වූ ජනතා ඉල්ලීම් වලට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා රජය 1989 වසරේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් පැන නගින පාඩු/හාණි වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල අරමුදලේ විෂය පථයට ඇතුලත් කිරීම සඳහා එකී විෂය පථය පුළුල් කිරීමට තීරණය කළේය. ඒ අනුව අරමුදල වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදල යනුවෙන් යළි නම් කරන ලදී.(මින් මතු එය වැවකැකෝ හා ත්‍රක්‍රියා අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබේ.)

අනතුරුව වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදල මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර 2005 වසරේ සිට එකී අරමුදල මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් කළමණාකරනය කරන ලදී. 2007 වසරේදී 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ වන රක්ෂණ භාර අරමුදල වෙත මේ වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදල මුළුමනින්ම අන්තර්ග්‍රහණය කරන ලදී.

මෙසේ වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදල අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව පණතේ 18 වගන්තියේ (1) උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ අරමුදලට බැර කරන ලද සියළු මුදල් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට මාරු කරන ලදී.

සමාගම් පණත යටතේ ලියාපදිංචි වී ඇති හා පවත්නා නීති යටතේ සාමාන්‍ය රක්ෂණ කටයුතු කරගෙන යාම සඳහා අවසර ලත් සියළු සෘජු රක්ෂකයන් හට මේ අරමුදලේ සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්ය වේ.

වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදලට අන්තර්ගත වන දෑ.

- රක්ෂණ සමාගම් හරහා වාරික එකතු කිරිම, අරමුදලට ඒවා බැර කිරීම හා ඉහල අනුපාත යට යටතේ ආයෝජනය කිරීම.
- හිමිකම් සඳහා වන ගෙවීම් ජාතික රක්ෂණ භාර අරමුදලේ සෘජු අධීක්ෂණයට යටත් වන අතර රක්ෂණ සමාගම් විසින් ගෙවිය යුතු වන හිමිකම් සහ වැවකැකෝ හා ත්‍රක්‍රියා අරමුදලට ප්‍රතිපූර්ණය කිරීම් ජාරභා අරමුදලේ අනුමැතිය මත විය යුතුය. (අරමුදල විසින් සපයනු ලබන ආවරණය ජාරභාඅරමුදල විසින් කලින් කලට තීරණය කරන ආකාරයට විවිධ ව්‍යාපාර පංති යටතේ උපරිම වටිනාකම් විචලනයන්ට සීමා වේ.)
- ලංකා බැංකුව විසින් පරිපාලනය කරන ලද, ත්‍රස්තවාදී ප්‍රහාර නිසා හානියට පත් ආයතන වෙත පිරිනමනු ලබන මෘදු ණය කලමණාකරනය.

- වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදලේ අරමුණු පහත පරිදි වේ:

❖ අරමුදල විසින් ආවරණය කරනු ලබන, වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ඇතුලත් කිරීම පිණිස ව්‍යාප්ත කරන ලද රක්ෂණ ඔප්පු මගින් නිර්වචනය කර ඇති පරිදි අරමුදලේ සියළු සාමාජිකයන් හට ලැබෙන, වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා හානි ආවරණය සඳහා වන රක්ෂණ වාරික වලින් අරමුදල ස්ථාපිත කිරීම.

❖ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ භූගෝලීය සීමාවන් තුළ ඇතිවන්නාවූ වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපලවලට සිදුවන පාඩු/හාණි සහ පුද්ගලයන්ට සිදුවන තුවාල හානි වෙනුවෙන්, භූගෝලීය සීමාවන්හි දිගුවක් සපයන සාමාන්‍ය රක්ෂණ අවදානම් වර්ග ඇතුළුව, රක්ෂණ ඔප්පුවේ නිර්වචනය කර ඇති ආකාරයට ආරක්ෂණය සැපයීම.

❖ මේ මගින් ශ්‍රී ලංකාවේ අරමුදලක් හරහා ආවරණ සපයමින් රටේ වටිනා වාරික මුදල් විදේශයන්ට ගලා යාම නවතාලිය හැකිය.

2012 වසර වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදලේ ව්‍යාපාර කටයුතු සාර්ථක වසරක් වූ අතර එමගින් පෙර වසරේ පැවති රුපියල් මිලියන 2006 ට සාපේක්ෂව තත් වසරේ ඒකාබද්ධ දල ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 2270 ක් දක්වා වර්ධනය වූවේය. ඒ අනුව ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුදල් ප්‍රමාණය පෙර වසරේ මුදල වූ රුපියල් මිලියන 3495 ඉක්මවා රුපියල් මිලියන 4200 ක් දක්වා ඉහල ගියේය.

2012 වසර තුළ වැඩ වර්ජන,කැරළි කෝලහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා ආවරණය සඳහා වන රජයේ අරමුදලේ කාරක සභා රැස්වීම් වාර 10 ද තාක්ෂණික උපදේශන කමිටු සභා රැස්වීම් වාර 10 ද පවත්වන ලදී. 2011 වසරේ රුපියල් මිලියන 25.3 ක්ව පැවති හිමිකම් වටිනාකම් ප්‍රමාණය හිමිකම් 160 ක් වෙනුවෙන් රුපියල් මිලියන 190ක් දක්වා වර්ධනය කිරීමේ ගෞරවය අරමුදල පරිපාලනය සඳහා පිහිටුවන ලද කාරක සභාව හා උපදේශන කමිටුවට හිමිවේ.

# ප්‍රතිරක්ෂණය



ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශය 2008 වසරේදී ස්ථාපිත කරන ලද්දේ 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/20 දරණ ගැසට් නිවේදනයෙහි නියම කර ඇති ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමටය.ඒ අනුව ජාරභා අරමුදල සාමාන්‍ය රක්ෂණයෙන් (ජීවිත රක්ෂණ නොවන) ප්‍රතිරක්ෂිත අවදානම් හි 20%ක අනිවාර්ය කොටසක් පිලිගෙන ඇත.

මේ අංශය ස්ථාපිත කිරීමේ මූලික අරමුණ විදේශ විනිමය රට තුළ රඳවා ගැනීමයි. මේ අංශය ප්‍රතිරක්ෂණ විෂය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රධාන රක්ෂණ සමාගම් වලට අවශ්‍ය සහය හා මාර්ගෝපදේශ සපයයි. එහෙයින් ජාතික රක්ෂණ භාර අරමුදල ‘ජාතික ප්‍රතිරක්ෂකයා ලෙස ප්‍රධාන හා තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි.

අදාල ගැසට් නිවේදනයේ නියම කර ඇති කොන්දේසි අනුව සියළුම ප්‍රධාන රක්ෂණ සමාගම් 20% ජාරභා අරමුදලේ ප්‍රතිරක්ෂණය කිරීම අනිවාර්ය කර ඇත. එසේම කවර ප්‍රධාන රක්ෂණ සමාගමකින් වුව හිමිකම් සඳහා වන ඉල්ලීම් අදාල පිලිගත් වගකීමට සමාන ප්‍රමාණයකින් පියවීමේ වගකීම ජාරභා අරමුදල උසුලනු ඇත.

ජාරභා අරමුදල සමග කටයුතු කරන රක්ෂණ සමාගම් පහත පරිදි වේ.

1. සී/ස එලයන්ස් රක්ෂණ සමාගම
2. අමානා තකාෆුල් රක්ෂණ සමාගම පී එල් සී
3. ඒසියන් එලයන්ස් රක්ෂණ සමාගම පී එල් සී
4. අවිවා එන් ඩී බී රක්ෂණ සමාගම පී එල් සී

5. සෙලින්කෝ රක්ෂණ සමාගම පී එල් සී
6. සී/ස චාර්ටිස් රක්ෂණ සමාලම
7. සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම
8. සී/ස සමුපකාර රක්ෂණ සමාගම
9. එච් එන් බී ඇෂුවරන්ස් පුද්ගලික සමාගම පී එල් සී
10. ජනශක්ති රක්ෂණ පුද්ගලික සමාගම පී එල් සී
11. සී/ස ලංකා ඔරික්ස් ලීසිං රක්ෂණ සමාගම
12. සී/ස එම් බී එස් එල් රක්ෂණ සමාගම
13. සී/ස ඔරියන්ට් රක්ෂණ සමාගම
14. සී/ස පීපල්ස් රක්ෂණ සමාගම
15. සී/ස සණස රක්ෂණ සමාගම
16. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
17. යූනියන් ඇෂුවරන්ස් සමාගම පී එල් සී

# 06. තිරසාර වාර්තාකරණය

ක්‍රියා මාර්ග අතරෙහි දුෂ්කර බව පැහැදිලි වුවද, තිරසරභාවය යන්න බෙහෝ ව්‍යාපාරික අභියෝග හමුවේ සංස්ථාපිත වැඩසටහනේ ස්ථිරවම තිබේ. පීටර් ඩ්‍රකර් වැන්නන් විශ්වාස කරන අන්දමට සමාගමක අරමුණ විය යුත්තේ සමාජයට සේවයක් කිරීමයි.

එහෙත් මෙහිදී පොදු සාධකය වන්නේ ව්‍යාපාරයට මෙන්ම සමාජයටද තිරසරභාවය මගින් එක් කල හැකි අමතර වටිනාකම වෙත යොමු විය යුතුය යන්නයි. ලාභයේ, ග්‍රහලෝකයේ හා ජනතාවගේ තෙපතුල් මායිම් කොරේ ඉන් සැලසෙන දායකත්වයයි.

තිරසරභාවය තුළ අද දවසේ සමාගම්වල උපායක්‍රම හා මෙහෙයුම් කෙරේ යොමුවන උපයෝගී හා විචක්ෂණ බලපෑමක් තිබේ. එය හුදෙක් ආචාර ධාර්මිකව වගකිව යුතුවීම යන්න නොවේ. ඒ වනාහී මනා ව්‍යාපාරයක් පිළිබඳ කරුණකි. අපතේ යාම හා අකාර්යක්ෂමතාව පිටු දැකීම මගින් පැහැදිලි ආර්ථික බලපෑමක් ඇතිවන අතර නියම ලෙස පතුල් සීමාවේ නියම බලපෑමක් ජනිත කරයි. තිරසරභායේ මුලපිරීම් නව ආදායම් මූලාශ්‍ර උත්පාදනය සඳහා  දිගුකාලීන ප්‍රතිලාභ සමග කෙටිකාලීන ස්පෘශ්‍ය ප්‍රතිඵල සම්බන්ධකර සන්නම් හා පිලිගැනීම වැනි අස්පෘශ්‍ය වත්කම් දියුණු කරයි.

තිරසරභාවය සංවිධානයකට කාවැදුන පසුව එහි උපායමාර්ගයන් හා මෙහෙයුම් මගින් බොහෝ මානයන් හරහා වටිනාකම් ලබාදිය හැකිය. :

- ආදායම් උත්පාදනය –නව නිෂ්පාදන,සේවා හා වෙළඳපල මගින්.
- පිරිවැය පාලනය – සම්පත් කාර්යක්ෂමතාව, පහල මට්ටමේ බලශක්ති පරිභෝජනය හා අපතේ යාම් අවම කිරීම.

තිරසරභාවය අත්කරගත යුතුනම් හා ප්‍රතිලාභ අත්පත් කරගත යුතු නම්, තිරසරභාවය හා එමගින් නිර්මාණය කරන වටිනාකම් ප්‍රමාණනය කර ව්‍යාපාර කාර්යසාධනය සමග සම්බන්ධ කළ යුතුය.

ජාතික රක්ෂණ භාර අරමුදලේ තිරසරභාවය පිළිබඳ උපායක්‍රම ව්‍යාපාරයේ හරය සමග මෙසේ එක එල්ලේ පිහිටයි:

- ජාරභා අරමුදල තිරසරභාවය වෙනුවෙන් උපායමාර්ගික ප්‍රවේශයක් අනුගමනය කරතිබේ.
- සියළු ව්‍යාපාරික තීරණ තිරසර සංවර්ධනයෙන් හා සංවිධාන වර්ධනයෙන් පැන නැගෙන විට ව්‍යාපාරය හා තිරසරභාවය පිලිබඳ උපායක්‍රම එකිනෙකින් යැපේ.
- තිරසරභාවය සියළු උපායමාර්ගික ව්‍යාපාර තීරණයන් තුළ ගැබ්වෙන බවත් සමාගමේ මෙහෙයුම් හී සෑම අංශයක් සමග ඒකාග්‍ර වන බවටත් ජාරභා අරමුදල සහතික වෙයි.

<u>**පාර්ශවකාර කණ්ඩායම් 1 - රජය**</u>


ඉතිහාසයේ ඉහලම දායකත්වය එනම් රුපියල් මිලියන 4,200 ඒකාබද්ධ අරමුදලට ලබා දෙමින් ජාරභා අරමුදල සිය වාර්ෂික දායකත්වය වර්ධනය කර ඇත. එය ඒකාබද්ධ අරමුදලට පෙර වසරේදී දැක්වූ රුපියල් මිලියන 3495ක දායකත්වයට වඩා 20%ක වර්ධනයකි.  සිය පසුගිය ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් ජාරභා අරමුදල

පිලිවෙලින් 2010, 2009 හා 2008 වසරවලද රුපියල් මිලියන 2000,2250 හා 1000 ක දායකත්වයක් ලබා දී ඇත.

වගුව – 6.01: ඒකාබද්ධ අරමුදලට දායක වීම්

| මුදල් වර්ෂය | රු මිලියන |
|---|---|
| 2006 | 4,000 |
| 2007 | - |
| 2008 | 1,000 |
| 2009 | 2,250 |
| 2010 | 2,000 |
| 2011 | 3,495 |
| 2012 | 4,200 |

වගුව –6.01: රටේ සංවර්ධනය උදෙසා ජාරභා අරමුදලේ දායකත්වය




**පාර්ශවකාර කණ්ඩායම 2 - පාරිභෝගිකයන්**

2012 වසර තුල ජාරභා අරමුදලට සිය හිමිකම් ගෙවීමේ හැකියාව පිළිබඳ පාරිභෝගික විශ්වාසය රඳවා ගනිමින් **RAM** වර්ගීකරණයේ ඉහලම අගය එනම් **AAA** තත්වය පවත්වා ගැනීමට හැකිව තිබේ. ජාරභා අරමුදල අඛණ්ඩව එම තත්වය යාවත්කාලීන කරමින් **RAM** වර්ගීකරණයේ ඉහලම අගය එනම් **AAA** තත්වය පවත්වා ගැනීමට කටයුතු කරයි.

2012 නොවැම්බර් 19 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ රන්දොර ශ්‍රවණාගාරයේ පැවති උත්සවයකදී ජාරභා අරමුදල විසින් මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි සුදුසුකම් ලත් හිමිකම් ඉල්ලුම්කරුවන් 30 දෙනකු අතර රුපියල් මිලියන 67කට වැඩි මුදලක් බෙදා දීමට කටයුතු යොදනලදී.

විදේශ සේවා නියුක්ති රක්ෂණය යටතේ ජාරභා අරමුදල 2012 වසරේ මුල් මාසයන් හී මැදපෙරදිග රටවල සේවා නියුක්තව සිටි ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් හට රක්ෂණාවරන ලබා දී තිබේ. එසේම ජාරභා අරමුදල 2012 වසර තුළ සහන පදනමක් යටතේ අග්‍රහාර රක්ෂණ ක්‍රමයද පවත්වාගෙන ගොස් ඇත.

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ සාමාජිකත්වය සඳහා දත්ත පදනමක් නිර්මාණය කිරීම පිණිස රජයේ සේවකයන් හට ඊ කාඩ් පතක් සැපයීම සඳහා ව්‍යාපෘතියක් සකසන ලද අතර ඒ අනුව සාමාජිකයන්හට අපහසුවකින් තොරව රෝහල් වෙතින් වෛද්‍ය සේවා ලබා ගත හැකිවෙනු ඇත.

**පාර්ශවකාර කණ්ඩායම් 3 – සමාජය**

2012 වසරේ අනුරාධපුර ඇලයාපත්තුවේ දැයට කිරුළ ප්‍රදර්ශණය පැවැත්වෙද්දී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නොමිලේ අක්ෂි සායනයක් පවත්වා උපැස් ප්‍රදාන වැඩසටහනක් පවත්වන ලදී. එසේම දැයට කිරුළ -2012 ප්‍රදර්ශණය වෙනුවෙන් පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරනයන් පිරිනමන ලදී.

2012 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ඇලයාපත්තුව ග්‍රාමීය රෝහලට වාට්ටුවක් ඉදිකර පරිත්‍යාග කිරීමට ජාරභා අරමුදල විසින් භාරගන්නා ලදී. මේ කර්තව්‍යය සඳහා ජාරභා අරමුදලේ අයවැයෙන් රුපියල් මිලියන 19.0 ක මුදලක් වෙන් කරන ලද අතර 2014 පෙබරවාරි මස ඊට මුල්ගල තබන ලදී.

පාර්ශවකරුවන් කණ්ඩායම **4 –** සේවකයන්

**පුහුණුව හා සංවර්ධනය**

ඉහළම කුසලතාවන්ගෙන් හෙබි ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ ප්‍රයත්නයේදී ප්‍රවීණතාව හා විශේෂඥතාව වර්ධනය කරනු පිණිස ව්‍යාපාරාභිමුඛ පුහුණුවක් කෙරේ ජාරභා අරමුදල විශ්වාසය තබයි.රක්ෂණ ක්ෂේත්‍රයට අදාලව අලුතින් ස්ථාපිත ආයතනයක් ලෙස ජාරභා අරමුදල සිය සේවකයන්ගේ රක්ෂණ කටයුතු හා ගිණුම්කරණය පිළිබඳ දැනුම වර්ධනය කිරීමට මග පෙන්වීම් සපයයි. මෙහිදී ජාරභා අරමුදල ඉන්දියානු රක්ෂණ විභාගයන්ට පෙනී සිටිනා සිය සේවකයන් හට උපකාරක පංති පවත්වා විභාග ගාස්තු සඳහා අනුග්‍රාහකත්වයද ලබා දී තිබේ. අදාල පංති පවත්වන ලද්දේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීය දේශකයකු විසිනි.

ගිණුම් අංශයේ සේවයේ නියුතු සේවකයන් හට වර්තමානයේ අවසන් ගිණුම් පිලියෙල කිරීමේදී භාවිතා කරනු ලබන Accpac ERP පද්ධතිය පිළිබඳ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

**විනෝදායන කටයුතු**

ජාතින රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික බක් මහා උළෙල 2012 අප්‍රියෙල් මස හෙන්රි පේද්‍රිස් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.





# 07. පාලන වාර්තාකරණය - ව්‍යවසාය පාලනය

### හැඳින්වීම

ව්‍යාපාර පාලනය යනු සංස්ථාපිත පාලනය හා සංවිධානයක ව්‍යාපාර පාලන දර්ශණයන් යන ද්විත්වයම ආවරණය කරනා රාමුවක් පිළිබඳ විස්තර කෙරෙමින් මතුව එන යෙදුමකි. කාර්යසාධන කළමණාකරනය හා උපායමාර්ගිකව සම්බන්ධවී ඇති යහපත් සංස්ථාපිත පාලනයක් ඇති කරගැනීම මගින් සමාගම් වලට සිය ව්‍යාපාර ඉදිරියට මෙහෙයවන ප්‍රධාන සාධක කෙරේ අවධානය යොමු කිරීමට හැකියාව ලබා දේ. මෙය එකවරම අභියෝගයක් මෙන්ම අවස්ථාවක්ද වෙයි.

මේ රාමුව සම්බන්ධයෙන් සඳහන් කල යුතු ප්‍රධාන කරුණ වන්නේ ව්‍යාපාර පාලන ක්‍රියාවලිය මගින් සමබරතාව පවත්වා ගැනීමට අවශ්‍ය සංස්ථාපිත පාලන ක්‍රියාවලියේ මානයන් දෙකක් එනම් අනුකූලතාව හා කාර්යසාධනය අන්තර්ග්‍රහණය කරගන්නා බවයි.
මණ්ඩල ව්‍යුහයන් සහ විධායක පාරිශ්‍රමික වැනි කාර්යභාරයන් කරුණු අනුකූලතා මානය මගින් ආවරණය කෙරේ. පද්ධති හා /හෝ ප්‍රමිතීන්ට පොදුවේ සහතික කිරීම/විගණනයට යටත්ව මේ මානයට ආමන්ත්‍රණය කල හැකිය.
කාර්යසාධන මානය කේන්ද්‍රගත වන්නේ උපායමාර්ග හා වටිනාකම් එකතු කිරීම වටාය. මෙහිදී අවධානය යොමු කෙරෙන්නේ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා මණ්ඩලයට සහය වීම අවධානම් කෙරේ හා කාර්යසාධනයේ ප්‍රධාන ප්‍රේරකයන් වෙත නැඹුරුව අවබෝධ කර ගැනීමය.
ව්‍යාපාර පාලන රාමුවේ කේන්ද්‍රය වන්නේ යහපත් සංස්ථාපිත පාලනයට වැරදීම් වලක්වා ගැනීමට සහය විය හැකි නමුදු එමගින් යහපත් ව්‍යාපාර කාර්යසාධනයක් සහතික නොකරන බවට වන තර්කයයි. දැනටමත් පෙනෙන්නට ඇති පරිදි සංස්ථාපිත අසාර්ථකත්වයන් වසර 2000 ගණන් වලදී සමීකරණයේ සංස්ථාපිත පාලන පාර්ශවය ප්‍රතිසංස්කරණය පිණිස වැදගත් ප්‍රයත්නයන් බිහි කර ඇති බවයි. එනමුදු මෑතක් වන තුරුම උපාය මාර්ගික තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම අනුව ගත් කල කාර්යසාධනය පැත්තෙන් වැඩි අවධානයක් යොමු කර නැති බවයි. ව්‍යාපාර පාලන රාමුව අපට ජාතික රක්ෂණ භාර අරමුදලේ දිගුකාලීන සාර්ථකත්වය වෙනුවෙන් අනුකූලතාව මෙන්ම කාර්යසාධනයේ වැදගත්කම වටහා ගැනීමට උපකාරී වෙයි.

විනය,පාරදෘෂ්‍යභාවය,ස්වාධීනත්වය,
වගවීම,වගකීම, සාධාරණත්වය, සහ සමාජ වගකීම වැනි ප්‍රමුඛ සංස්ථාපිත වටිනාකම් භාවිතා කරන අතරේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සංස්ථාපිත පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය හා යහ පාලනය හා සංස්ථාපිත පාලනය පිළිබඳ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශයන් මගින් දක්වන ව්‍යාපාර පාලන පරිචයන් ජාරභා අරමුදල මගින් ක්‍රියාත්මක කෙරේ.

### මූල්‍ය සහ රක්ෂණ නිපුණතාව

2012 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපති විසින් මූල්‍ය හා රක්ෂණ නිපුණතාව ශක්තිමත් කරන ලදී.

### ජාරභා අරමුදල් මණ්ඩලයේ සංයුතිය

ජාරභා අරමුදල මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අට දෙනකුගෙන් යුත් මණ්ඩලයක් විසින් කළමණාකරනය කෙරේ. ඊට මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරියකු, මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී, සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරියකු, රාජ්‍ය පිරපාලන අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරියකු, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂක ජනරාල් සහ මූල්‍ය, බැංකු, රක්ෂණ, කළමණාකරන සහ නීතිය යන ක්ෂේත්‍ර නියෝජනය කරන විශේෂඥයින් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තවත් තිදෙනකු අයත් වේ. සභාපති ලෙස මණ්ඩලයේ අයකු පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත. පණත අනුව සියළු මණ්ඩල සාමජිකයන් පත් වූ දින සිට වසර පහක කාලයක් සඳහා තනතුරු දැරිය යුත්තේය. මණ්ඩල සාමාජිකයන්ගේ නම් ජාතික රක්ෂණ භාර අරමුදලේ මණ්ඩල සාමජිකයන්-2012 යන පිටුවේ දැක්වේ.

### චර්යා ධර්ම පද්ධතිය

කළමණාකරණය සහ සියළු කාර්ය මණ්ඩලය විධිමත් චර්යා ධර්ම පද්ධතියකට යටත් වන අතර එමගින් අපේ ව්‍යාපාර මෙහෙයුම් පවත්වනු ලබන ආචාර ධර්ම හා මූලධර්ම අනුව ඔවුන් විශේෂ වගකීම් වලට යටත් කෙරේ. ජාරභා අරමුදලේ චර්යා ධර්ම පද්ධතිය වසරකට වරක් කාර්යසාධන ඇගයුම් අතර තුර ඇගයුමට ලක් කෙරේ.

### ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය

ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්හි නිරත කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් අනුගමනය කලයුතු විස්තීර්ණ ප්‍රසම්පාදන ප්‍රතිපත්තියක් ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබ තිබේ. ප්‍රසම්පාදන කාර්යයන් පවත්වාගෙන යනු ලබන්නේ Procurement NPA ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත් මත පදනම්වය.

### මූල්‍ය ප්‍රකාශ

ජාතික රක්ෂණ භාර අරමුදල එහි මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති හා IBSL රෙගුලාසි මෙන්ම අනෙක් අදාල නීති හා රෙගුලාසි අනුවය. පාර්ශවකරුවන්ට විචක්ෂණ තීරණ ගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කාර්යසාධනය පිළිබඳ විස්තරාත්මක හා පාරදෘෂ්‍ය විග්‍රහයක් හා අනාගත උපාය මාර්ගයන් සපයයි.

### ව්‍යාපාරික හැසිරීම් සහ ආචාර ධර්ම

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ස්වකීය සේවකයන් ගේ චර්යාව වෙනුවෙන් මනාව පිළිගත් ව්‍යාපාර හැසිරීම් සහ ව්‍යාපාර ආචාර ධර්ම යෝග්‍ය සේ සකස් කර ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර එම චර්යාවන් සහ ආචාර ධර්මවලට මහජනතාව තුළ හැසිරීම, සදාචාරමය ව්‍යාභාරික ප්‍රමිතීන් සහ වංචාසහගත නොවන චර්යාව ජාතික රක්ෂණ භාර

අරමුදලේ වත්කම් ආරක්ෂා කිරීම සහ විධිමත් භාවිතය, අභිලාෂයන් පිළිබඳ ගැටුම් මගහරවා ගැනීම, රක්ෂණ පාරිභෝගිකයින් හා ජාතික රක්ෂණ භාර අරමුදලේ සේවාදායකයින් සමඟ කටයුතු කිරීමේදී සාධාරණව කටයුතු කිරීම, ජාතික රක්ෂණ භාර අරමුදලේ පරිගණක පද්ධති විධිමත් පරිදි භාවිතා කිරීම, පාරිභෝගික තෘප්තිය, නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම ඇතුළත් වේ.

- වාර්ෂික වාර්තාව-2012

දැනුවත් තීරණ ගැනීම සඳහා 2012 වසර තුළ භාරභා අරමුදලේ කාර්යයන් ගැන පූර්ණ දර්ශණයක් සපයනු වස් ජාතික රක්ෂණ භාර අරමුදලේ 2012 වසරේ වාර්ෂික වාර්තාව පිළියෙල කර තිබේ.

- තොරතුරු සැපයීම

මණ්ඩල රැස්වීම්වලට පෙර සාමජිකයන් හට කාර්යසාධනය පිළිබඳ මාසික වාර්තා, පූර්ව මණ්ඩල රැස්වීම් වාර්තා සහ මණ්ඩල පත්‍රිකා සපයනු ලැබේ. මණ්ඩල තීරණ ගැනීම උදෙසා සභාපති සහ මණ්ඩලය මාසිකව රැස්වේ. 2012 වසර තුළ මණ්ඩලය රැස්වීම් වාර 16 ක් පවත්වා ඇත. 2012 වසර තුළ විගණන කමිටු රැස්වීම් වාර 5 ද පවත්වා තිබේ.

- අභ්‍යන්තර පාලනය

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය හා එහි කාර්යක්ෂමතාව සමාලෝචනය පිළිබඳව මණ්ඩලය මූලික වශයෙන් වගකීමෙන් බැඳේ. අභ්‍යන්තර විගණකයින් හා කළමනාකරනය නිරතුරුවම සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතීන් හි කාර්යක්ෂමතාව සමාලෝචනයට ලක් කරති. අවම වශයෙන් සෑම කාර්තුවකටම වරක් සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතීන් හි කාර්යක්ෂමතාව පිළිබඳව අභ්‍යන්තර විගණකයන් මෙන්ම කළමණාකරනයේද තොරතුරු සොයා ගැනීම් ගැන විගණන කමිටුව සමාලෝචනයක යෙදේ.

විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන සැලසුම් හා විෂය පථය පිළිබඳ සමාලෝචනය කිරීම හා එකඟ වීම, අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටදී අදාල ගැටළු හා කළමනාකරණය පිළිබඳ සාකච්ඡා කිරීම, ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය පිළිබඳ සමාලෝචනය කිරීම සහ එම අවදානම් අවම කිරීමට ගනු ලබන ඉදිරි පියවර පිළිබඳ සාකච්ඡා කිරීම හා එකඟ වීම, සෑම අවස්ථාවකදීම අභ්‍යන්තර/බාහිර විගණකවරුන් සමග සඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම, අවශ්‍ය අවස්ථාවලදී ජාතික රක්ෂණ භාර අරමුදලට අදාළ කරුණු හා සාකච්ඡා කිරීම පිණිස අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් වෙන වෙනම හමුවීම වැනි විවිධ යාන්ත්‍රණ හරහා මූල්‍ය හා මූල්‍ය නොවන පාලන පද්ධති පරිපූර්ණව අධීක්ෂණය කරනු ලබයි.

2012 වර්ෂය තුලදී බාහිර විගණන කටයුතු සිදු කරනු ලැබුවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි. එම වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණනය සහ වැඩ වර්ජන ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලැබ ඇත්තේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසිනි.

- විගණන කමිටුව

2012 වසර තුළ විගණන කමිටුව 5 වරක් රැස්ව තිබේ. විගණන කමිටුව ආයතනයේ කළමණාකරනය නීති රීති හා රෙගුලාසි පිළිපදින බවට තහවුරු කර ගැනීම සඳහා පරිචයන් අනුගමනය කරමින් මූල්‍ය වාර්තාකරණය, භාහිර විගණනය, අනුකූලතා හා නෛතික ක්‍රියා මාර්ග, අවදාලම් කළමණාකරනය, අභ්‍යන්තර පාලනය හා අභ්‍යන්තර විගණනය කෙරේ අවධානය යොමු කරමින් රක්ෂණ යෝජනා ක්‍රමයන්හි කාර්යක්ෂමතාව පිළිබඳ අධීක්ෂණය කරයි.

**සංයුක්ත පාලන අනුගතවීම**

| සංයුක්ත පාලන මූලිකාංග | ජාතික රක්ෂණ භාර අරමුදලේ අනුකූලතා මට්ටම |
|---|---|
| සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී | ප්‍රධාන විධායක නිළධාරී ගේ කාර්යභාරය ඉටු කිරිම සභාපතිවරයාට මණ්ඩලය මගින් බලය පවරා ඇත. |
| වගකීම් පැවරීම | මණ්ඩලයේ නායකත්වය සඳහා සභාපතිවරයා වගකිව යුතුයි. විශේශයෙන්ම සිදුවන කාර්ය ඉටු කරයි.<br>• මණ්ඩලය සම්බන්ධයෙන් කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියාත්මක වීම සහ එහි කමිටු සමඟ උසස් සම්මත වූ ව්‍යවසාය පරිපාලනයක් සුරක්ෂිත කිරීම<br>• සංවර්ධන උපායමාර්ගය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහයෝගය දැක්වීම සහ වඩාත් පුළුල් වශයෙන්, ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයට උපදෙස් ලබාදීම හා සහයෝගය දැක්වීම කළ යුතුය. එක් එක් අංශයන්හි නායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගකිව යුතු අතර මණ්ඩලය මගින් අභිනියෝජනය කළ අධිකාරීන් තුළින් කළමනාකරණය සිදු කළ යුතුය.<br>• මණ්ඩලය මගින් නිර්දේශ කිරීම සඳහා උපායමාර්ග යෝජනා වැඩි දියුණු කිරීම සහ එම සම්මත වූ උපායමාර්ග ව්‍යාපාරය තුළට පරාවර්තනය කිරිම සුරක්ෂිත කිරීම<br>• මණ්ඩලයට සහයෝගය දැක්වීමට මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සම්මත වූ උපායමාර්ග සමඟ වෙනස් නොවන වාර්ෂික සැලසුම් සංවර්ධනය කිරීම<br>• ආයතනයේ සැලසුම් වෙත ළඟා වීමට අවශ්‍ය කරන ධාරිතාවන් සහ සම්පත් සුරක්ෂිත කිරීම සඳහා මානව සම්පත් සැලසුම් කිරීම |

| | |
|---|---|
| | • සංවිධානාත්මක ව්‍යුහයන් සංවර්ධනය කිරිම සහ කාර්යක්ෂම සංවිධානයන්වල සම්පත් සුරක්ෂිත කිරීම සඳහා පද්ධතීන් සහ ක්‍රියාදාමයන් පිහිටුවීම<br>• සම්මත සැලසුම්,උපායමාර්ගයන් සහ ප්‍රතිපත්තීන් සමඟ ව්‍යාපාරයේ කාර්යසාධනය තුළ සංගතබාවය සඳහා මණ්ඩලයට වගකිව යුතු වීම<br>• කාර්යසාධන සම්බන්ධතාවන් සහ ඇගයුම් සංවර්ධනය ඇතුළත්ව, විධායක කමිටුවට මඟ පෙන්වීම |
| ප්‍රසම්පාදන කමිටුව | දෙපාර්තමේන්තු මට්ටමින් ප්‍රසම්පාදන කමිටුවක් ස්ථාපිත කර නැත. එක් එක් කරුණට අදාලව ප්‍රසම්පාදනයේ වටිනාකම සලකා බලමින් සුළු හෝ මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටු පත් කර තිබේ. |
| විගණන කමිටුව | විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්ගෙන් සමන්විත වේ. විගණන කමිටුව එහි වගකීම පවත්නා මූල්‍යාමය සහ පරිපාලනය තුළ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි.<br>**විගණන කමිටුව**<br>*2012* වර්ෂය තුලදී විගණන කමිටුව පිහිටවනු ලැබූ අතර එහි විෂය පථය පහත දක්වා ඇති පරිදි වේ.<br>**1.** අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කරලීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය<br>**2.** ආයතනයේ සියළුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇඟයීම<br>**3.** පිරිවැය ඵලදායිතාව සඳහා කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය සහ අපතේ යන වියදම් ආදිය දුරලීම<br>**4.** බාහිර විගණන සමඟ සමායෝගය හා විගණකාධිපතිවරයාගේ බාහිර කළමනාකරණ ලිපිවල සඳහන් උපදෙස් අනුගමනය කිරීම<br>**5.** අණපනත් නීති රීති සහ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බැව් නිශ්චිත වශයෙන් සොයා දැන ගැනීම<br>**6.** ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සහතික කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය<br>**7.** ප්‍රතිකර්ම වශයෙන් පියවර ගැනීම සහතික කරගනු පිණිස අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සමාලෝචනය<br>**8.** පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම |

<table>
<tr>
<td></td>
<td>සමාලෝචනය කිරීම<br><br>2012 වර්ෂය තුළදී විගණන කමිටුව අවස්ථා 05 කදී රැස්ව ඇත. නීති සහ රෙගුලාසිවල යටත් වීම සහතික කිරීම මූල්‍ය වාර්තාකරණය කේන්ද්‍රගත කරගනිමින් ඵලදායි රක්ෂණ වැඩසටහන් කළමනාකරණය සහ මූල්‍යකරණය, බාහිර විගණනය, අවධානම් කළමනාකරණය, අනුකූලතාව දැක්වීම සහ නඩු කීම,අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණනය කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කර ඇත.</td>
</tr>
<tr>
<td>මණ්ඩල රැස්වීම්</td>
<td>මණ්ඩලය විසින් මෙහෙයවන ලද මණ්ඩල රැස්වීම් 16 ක් 2012 වර්ෂය තුළ පැවැත්වූ අතර රැස්වීමට සහභාගි වීමේ විශිෂ්ට වාර්තාවක් ද තබන ලදි. අධ්‍යක්ෂකවරුන්ගේ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීමේ තොරතුරු පහත දැක්වේ .
<table>
<tr><th></th><th>පත්වීම් දිනය</th><th>සහභාගි වූ රැස්වීම් ගණන</th></tr>
<tr><td>එස්.ඩී. අබේගුණසේකර මහතා<br>සභාපති</td><td>10.05.2010</td><td>03</td></tr>
<tr><td>ඩී. විදානගමාච්චි මහතා<br>සභාපති</td><td>09.10.2012</td><td>05</td></tr>
<tr><td>වෛද්‍ය එල්. සමරවික්‍රම මහතා<br>සාමාජික</td><td>11.06.2010</td><td>16</td></tr>
<tr><td>ඒ.කේ. සෙනෙවිරත්න මහතා<br>සාමාජික</td><td>08.07.2011</td><td>16</td></tr>
<tr><td>එන්. කුලසේකර මහතා<br>සාමාජික</td><td>18.07.2011</td><td>16</td></tr>
<tr><td>ජේ. දඩල්ලගේ මහතා<br>සාමාජික</td><td>23.06.2010</td><td>10</td></tr>
<tr><td>ඩබ්.එච්. පියදාස<br>සාමාජික</td><td>10.07.2010</td><td>13</td></tr>
</table>
</td>
</tr>
</table>

| | |
|---|---|
| | යහ පාලන පරිචයන් වෙත සිය කැපවීම පල කරමින් ඉහල ආචාර ධාර්මික චරිතාකම් හා වගවීමක් සහිතව සිය යුතුකම් ඉටු කිරීමට මණ්ඩල සාමාජිකයෝ දැඩි අවධානයක් යොමු කරති. ප්‍රබල ව්‍යාපාරික ආචාරධර්ම, යහපත් ප්‍රතිපත්ති හා පරිපාටි, සඵලදායී හා කාර්යක්ෂම අධීක්ෂණ පද්ධති යහපත් සංයුක්ත පාලන පද්ධතියක කොටස් සේ සැලකේ. |
| වගවීම සහ විගණනය | අනුමතකරන ලද ව්‍යාපාරික සැලැස්ම මත මෙහෙයවන යෝග්‍ය ආකාරය රඳා පැවතීම සහ ආයතනය ළඟා වූ සහ නොවූ මූල්‍ය ඉලක්ක සුරක්ෂිත කිරීමට ආයතනයේ පාර්ශවකරුවන් වෙත මණ්ඩලය වගකිව යුතුවේ. |
| මූල්‍යමය වාර්තාව | රජයේ අවශ්‍යතාව අනුව,භාණ්ඩාගාර චක්‍රලේඛයන් වලින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අදාලව සහ අනුමැතිය තුළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සකස් කෙරෙන බවට ජා රභා අරමුදල් මණ්ඩලය සුරක්ෂිත වෙයි.<br><br>• **වාර්ෂික වාර්තාව 2012**<br><br>මැනවින් සලකා බලන ලද තීරණ ගැනීම පිණිස 2012 වර්ෂය තුළදී ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතු පිළිබඳ සමස්ත තක්සේරුවක් ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදලේ 2012 වාර්ෂික වාර්තාව සකස් කරනු ලැබ ඇත.<br><br>• **මූල්‍ය ප්‍රකාශ**<br><br>ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව ඉදිරිපත් කරන ලදි. |

# 08. පාලන වාර්තාකරණය -

# ව්‍යාපාර අවදානම් කළමනාකරණය

## හැඳින්වීම

ව්‍යාපාර අවදානම් කළමණාකරනය යනු කවර සංවිධානයක වුව උපාය මාර්ගික කළමණාකරනයේ කේන්ද්‍රීය කොටසකි. ඒ වනාහි සංවිධානයන් තම කටයුතු වලට එල්ලවන අවදානමට ක්‍රමාණුකූලව ආමන්ත්‍රණය කරනා ක්‍රියාවලියයි. සාර්ථක අවදානම් කළමණාකරන මූලාරම්භයක් සංවිධානයේ අවදානම් මට්ටමට අනුපාතිකව පැවතිය යුතු අතර අනෙක් සංස්ථාපිත කාර්යයන් හා එක පෙලට තිබිය යුතුය. එසේම විෂය පථය අතින් විස්තීර්ණ විය යුතු සේම දෛනික කාර්යයන්ට බද්ධව පැවතිය යුතුය. තවද වෙනස් වන පරිසරයන්ට ගතික විය යුතුය. අවදානම් කළමණාකරනය යොමු විය යුත්තේ ප්‍රධාන අවදානම් තක්සේරු කිරීමට හා අවදානම් සඳහා සුදුස ප්‍රතිචාර දැක්වීමටය. මෙහි අරමුණ වන්නේ සංවිධානයේ සියළු කාර්යයන්ගෙන් උපරිම තිරසර වටිනාකම උකහා ගැනීමටය. අවදානම් කළමණාකරනය සංවිධානයට බලපෑ හැකි සාධකවල ඉහල සහ පහල විභව්‍යතා වටහා ගැනීමේ හැකියාව වර්ධනය කරයි. එය සාර්ථකත්වය සඳහා වන ඉඩ ඉහල දමා සංවිධානයේ අරමුණු ළඟා කරගැනීම ට බාධාකාරී වන අවිනිශ්චිතතා සහ අසාර්ථක වීමට ඇති ඉඩ පහත හෙලයි.

අවදානමක් විග්‍රහ කිරීමේ වැදගත් කොටසක් වනුයේ එහි ස්වභාවය, මූලාශ්‍ර, හෝ අවදානමේ බලපෑම තීරණය කිරීමයි. අවදානම් වර්ගීකරන පද්ධතියක් භාවිතා කිරීම මගින් අවදානම් ඇගයුම දියුණු කල හැකිය. අවදානම් වර්ගීකරන පද්ධති වැදගත් වන්නේ එය සංවිධානයකට සමාන අවදානම් හි වැඩි වීම පිළිබඳව හඳුනා ගැනීමට ඉඩ සලසන බැවිනි. තවද අවදානම් වර්ගීකරන පද්ධතියක් ආයතනයකට වඩා අවදානම් සහගත උපායමාර්ග, උපායක්‍රම හා මෙහෙයුම් හඳුනා ගැනීමට ඉඩ සලසයි. අවදානම් වර්ගීකරණ පද්ධති සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය පාලනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව, පිළිගැනීම, සහ වාණිජ ක්‍රියාකාරකම් වලට අදාල අවදානම් විභේදනය මතය. කෙසේ වෙතත් සියළුම ආකාරයේ සංවිධාන වලට පොදුවේ අදාල කරගත හැකි අවදානම් වර්ගීකරන පද්ධති නොමැත.

අවදානම් කළමණාකරන ප්‍රතිපත්තියකට පහත අංශ ඇතුළත් විය යුතුය.

- අවදානම් කළමණාකරන හා අභ්‍යන්තර පාලන අරමුණු (පාලනය)
- අවදානම කෙරේ සංවිධාන ආකල්ප ප්‍රකාශය (අවදානම් උපාය මාර්ගය)
- අවදානම දැනුවත් සංස්කෘතිය හෝ පාලන පරිසරය පිළිබඳ විස්තරය
- පිලිගත හැකි අවදානම් මට්ටම හෝ එහි ස්වභාවය (දැරිය හැකි අවදානම)
- අවදානම් කළමණාකරන සංවිධානය හා වැඩ පිලිවෙල (අවදානම් නිර්මාණ ශිල්පය)
- අවදානම් හඳුනාගැනීම හා ශ්‍රේණිගත කිරීම පිලිබඳ පරිපාටි විස්තර (අවදානම් තක්සේරුව)
- අවදානම් විග්‍රහය හා වාර්තාකරණය පිලිබඳ ලේඛණගත කිරීම (අවදානම් ප්‍රොටොකෝලයන්)
- අවදානම් අවම කිරීමේ අවශ්‍යතා සහ පාලන යාන්ත්‍රණයන් (අවදානම් ප්‍රතිචාර)
- අවදානම් කළමණාකරන කාර්භාරය හා වගකීම් තීරණය කිරීම

- අවදානම් කළමණාකරන පුහුණු අවශ්‍යතා හා ප්‍රමුඛතා
- අවදානම් සලකුණු කිරීම හා අධීක්ෂණය පිණිස වන නිර්ණායක
- අවදානම් කළමණාකරනය සඳහා සුදුසු සම්පත් වෙන් කිරීම
- එළඹෙන වසර සඳහා අවදානම් ක්‍රියාකාරකම් අවදානම් ප්‍රමුඛතා

| අවදානම | අවදානමේ ස්වභාවය | ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01.උපායමාර්ගික අවදානම | තීරණය කරන ලද අරමුණු කරා ළඟා වීමට ඇති නොහැකියාව, අභ්‍යන්තර හා බාහිර පරිසරයේ අනපේක්ෂිත වෙනස්කම් නිසා සංස්ථාපිත සැලසුම හා අයවැය අනදාල හෝ නුසුදුසු බවට පත් වීම උපාය මාර්ගික අවදානම යන්නට අදාල වේ. | සේවාලාභී මෙන්ම තරගකරුවන්ගේ ගතිකයන්,මෙන්ම පොදු පරිසරයේ වන දේශපාලන, තාක්ෂණික, සමාජ සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයන් අධීක්ෂණය කිරීමෙන් පසු සංස්ථාපිත සැලසුම පිලියෙල කිරීම මගින් මේ තත්වය කළමණාකරනය කෙරේ. විභව්‍ය අවදානම් වලට ආමන්ත්‍රණය කරමින් ඊළඟ පස් වසර සඳහා සැලසුම් ඇතුලත් කරමින් සෑම වසරකම සංස්ථාපිත සැලසුම සකසන අතර විස්තරාත්මක සමාලෝචනයකින් පසු එය මණ්ඩලය විසින් අනුමත කෙරේ. |
| 02. කීර්තිනාම අවදානම | විශේෂ සිද්ධියක් හෝ හැසිරීමක් නිසා ජාතික රක්ෂණ භාර අරමුදලේ විශේෂ සිද්ධියක් හෝ හැසිරීමක් හේතුවෙන් ඇතිවන සංස්ථාපිත ප්‍රතිරූපයේ හෝ කීර්තිනාමයේ අඩුවීම වේ. | කවර හෝ විය හැකි අවදානම් කල් තබා හඳුනා නිසි ක්‍රියාමාර්ග ගත හැකිවන පරිදි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, මහ බැංකුව හා කර්මාන්තයේ අනෙක් පාර්ශව මෙන්ම අනෙක් පාර්ශවකරුවන් වැනි නියාමකයන් සමග කළමණාකරනය යහපත් සබඳතා පවත්වයි. මහ ජනයා වෙත තොරතුරු නිකුත් කිරීම සභාපති හා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියට යටත් වේ. |
| 03.අනුකූල වෙළඳ අවදානම | අදාල නීති රීති රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රත්පත්ති, පරිපාටිහෝ ආචාරධාර්මික ප්‍රමිතීන්,අනුගමනය කිරීමට නොහැකිවීම මත ජාරභා අරමුදලේ කීර්තිනාමයට හානි වීම හා ව්‍යාපාර ඛණ්ඩ වීමේ අවදානම, ව්‍යාපාර කටයුතු කඩ වීම සහ එය සේවාලාභීන්ට, කාර්ය මණ්ඩලය හා අනෙක් පාර්ශවකරුවන්ට අහිතකර ලෙස බලපෑම වේ. | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වැනි විවිධ පාලන මණ්ඩල මගින් පනවා ඇති නීති රීති හා රෙගුලාසි අනුගමනය කරමින් ජාරභා අරමුදල මේ අවදානම අවම කරගෙන තිබේ. |

| | | |
|---|---|---|
| 04.ජාත්‍යන්තර අවදානම | ජාත්‍යන්තර සමාජ-සංස්කෘතික, ආර්ථික, හා තාක්ෂණික සාධක හරහා වන වෙනස්කම් තුළින් පැන නගින අවදානම මීට අදාල වේ. ජාරභා අරමුදල ප්‍රතිරක්ෂණයේ හා විදේශ් රැකියා රක්ෂණයේ නිරත වන හෙයින් ජාත්‍යන්තර PESTEL සාධක අරමුදලට බලපායි.. | ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන් ඉන්නා මැද පෙරදිග රටවල ප්‍රවණතා අධීක්ෂණය හා ජාරභා අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශයට අදාල ජාත්‍යන්තර ව්‍යාපාර ප්‍රවණතා අධීක්ෂණය හරහා ජාරභා අරමුදල අවදානම් අවම කරයි. |
| 05.රක්ෂණ වගකීම් අවදානම | පිලිගත නොහැකි තරමේ ඉහල අවදානම් පිලිබඳ හිමිකම් ඉල්ලීම් හා ප්‍රමාණවත් අවදානම් වාරික නොදරන අවදානම් අනුපාත පිලිගැනීම වැනි රක්ෂණ ව්‍යාපාර මීට අදාල වේ. | මේ අවදානම අවම කරනු පිණිස වාරික තීරණය කිරීමේ කමිටුව පිහිටුවා ඇත. බෙදාහැරීමේ ජාලයට අනුයුක්ත කර ඇති පිරිස් ඇතුළුව රක්ෂණ හා හිමිකම් කළමණාකරන කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට හා සංවර්ධනය කිරීමට කැපී පෙනෙන ආයෝජනයන් කර ඇත. |
| 06.විදේශ විනිමය අවදානම | ඩොලර්,ස්ටර්ලින් පවුම්, යුරෝ වැනි විවිධ විනිමයන්හී විදේශ විනිමය අනුපාතයන්හී උච්චාවචනයන් මගින් ඇති කරන අයහපත් බලපෑම් මින් අදහස් වේ. | මේ අවදානම අවම කිරීම උදෙසා ප්‍රතිරක්ෂණ වාරික ගෙවීමට බෙහෝ ප්‍රතිරක්ෂණ ගිවිසුම් දේශිය විනිමය වටිනාකම්වලින් ඇති කරගෙන තිබේ. |
| 07.තොරතුරු තාක්ෂණ අවදානම | තොරතුරු තාක්ෂණ අවදානම පැන නැගෙන්නේ ජාරභා අරමුදලේ දත්ත හා පවත්නා තොරතුරු ඇසුරිනි. තොරතුරු තාක්ෂණ අවදානම් අවම කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීම මගින් ජාරභා අරමුදල මීට මුහුණ දේ. | යටිතල සහ දත්ත පදනම් පාර්ශවයන් හරහා තොරතුරු ආරක්ෂාව, තොරතුරු සහිතබව පවත්වා ගනිමින් අනවශ්‍ය පුනරුක්තිය මගහරවා ගනියි. අපේ සේවා දායකයන්ට නිවැරදි හා තත්කාලීන තොරතුරු තාක්ෂණ සේවා සපයනු පිණිස තොරතුරු තාක්ෂණ අංශය වෛරස් නාශක හා තොරතුරු රැක ගැනීම සඳහා විසඳුම් සලසමින් ඒ සමග සුළු පරිමාණ ව්‍යසන සඳහා පිළියම් සමග විවධ සේවා සපයයි. |

| | | |
|---|---|---|
| 08.ණය අවදානම | ප්‍රති පාර්ශව සිය බැරකම් ගෙවීම පැහැර හැරීම හෝ ගෙවීමට නොහැකි වීම මත සමාගමට මූල්‍ය අලාභ සිදුවීමට ඇති ඉඩ මෙයින් අදහස් වේ. සිය ආයෝජන හා මෘදු ණය නිසා ජාරභා අරමුදල මේ අවදානමට ලක්වේ. | ලැබිය යුතු ප්‍රතිරක්ෂණ ඇතුළුව සියළු ලැබිය යුතු දෑ මාසික පදනමින් සමාලෝචනය කරන අතර නියම වෙලාවට අය කිරීම් සිදු කරයි. ජාරභා අරමුදල් පණත මගින් ඉඩ සලසනුයේ රාජ්‍ය ආරක්ෂණයන්හී ආයෝජනයට පමණක් හෙයින් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර REPOs වැනි දෑ හරහා රාජ්‍ය බැංකු සමග නිදහස් ආයෝජනයන් කරමින් මේ අවදානම කළමණාකරනය කෙරේ. |
| 09.හිමිකම් ගෙවීම් අවදානම | වංචනික නෛතික හා තාක්ෂණික කාරණා හේතුවෙන් පැන නැගිය හැකි ආරවුල් පිළිබඳ අවදානම | හිමිකම් ඉල්ලීම් අනුමත කිරීම සඳහා දැඩි රෙගුලාසි පැනවීමට කටයුතු කිරීම හා හිමිකම් ක්‍රියාවලියට අදාල රාජකාරි බෙදා වෙන් කරමින් අවශ්‍ය මූලාරම්භයන් ගෙන වංචනික නෛතික හා තාක්ෂණික කාරණා පාලනය කරනු ලබයි. |

# 09. මූල්‍ය ප්‍රකාශ 2012

# ආදායම් ප්‍රකාශය

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)*

*දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා*

| | සටහන් | 2012 අග්‍රහාර සහ අනෙක | 2012 SRCC&T අරමුදල | 2012 එකතුව | 2011 එකතුව |
|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | |
| ශුද්ධ වාරික ආදායම | **01** | 837,526,229 | 2,185,221,592 | **3,022,747,821** | 2,488,711,994 |
| අග්‍රහාර දායකත්වය | **02** | 863,435,521 | - | **863,435,521** | 1,117,653,037 |
| **ප්‍රතිලාභ , හානි සහ වියදම්** | | | | | |
| රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ | **03** | (1,898,258,796) | (383,211,955) | **(2,281,470,751)** | (1,879,486,696) |
| | | (197,297,047) | 1,802,009,637 | **1,604,712,590** | 1,726,878,335 |
| **අනෙක් ආදායම්** | | | | - | - |
| ආයෝජන ආදායම් | | 84,627,761 | 531,185,783 | **615,813,544** | 723,412,241 |
| ණය පොලී | | - | 7,278,316 | **7,278,316** | 10,163,846 |
| අනෙක් ආදායම් | | 18,732,336 | 153,846 | **18,886,182** | 743,614 |
| | | 103,360,097 | 538,617,945 | **641,978,043** | 734,319,701 |
| **වියදම්** | | | | - | - |
| කාර්ය මණ්ඩලාශ්‍රිත පිරිවැය | **04** | 69,828,165 | 2,178,544 | **72,006,709** | 56,000,854 |
| පරිපාලන වියදම් | **05** | 50,237,624 | 24,164,860 | **74,402,484** | 68,915,550 |
| මූල්‍ය සහ අනෙකුත් වියදම් | **06** | 3,666,682 | 13,591,592 | **17,258,273** | 21,581,925 |
| **මුළු වියදම** | | 123,732,470 | 39,934,997 | **163,667,466** | 146,498,329 |
| **බදුවලට පෙර ඉපයුම්** | | (217,669,420) | 2,300,692,586 | **2,083,023,166** | 2,314,699,707 |
| **බදුකරණය** | | - | - | - | 108,349,446 |
| **බදුවලට පසු ඉපයුම්** | | **(217,669,420)** | **2,300,692,586** | **2,083,023,166** | **2,206,350,261** |

# ශේෂ පත්‍රය

ජාතික රක්ෂණ භාර අරමුදල

ශේෂ පත්‍රය

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)*

*දෙසැම්බර් 31 දිනට*

| | සටහන් | 2012 අග්‍රභාර හා අනෙක් | 2012 වැවසිඅකැකෝ හා ත්‍රක්‍රියා | 2012 එකතුව | 2011 එකතුව |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | **07** | 21,414,642 | 3,324,560 | **24,739,202** | 29,606,877 |
| ආයෝජන | **08** | 969,761,256 | 4,406,153,417 | **5,375,914,672** | 4,444,546,262 |
| | | 991,175,898 | 4,409,477,976 | **5,400,653,874** | 4,474,153,140 |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබිය යුතු | **09** | 240,641,969 | 1,424,005,867 | **1,664,647,836** | 1,927,814,565 |
| මුදල් හා මුදල් සමාන දෑ | **10** | 94,964,525 | 8,676,871 | **103,641,397** | 3,542,969,945 |
| | | 335,606,495 | 1,432,682,738 | **1,768,289,233** | 5,470,784,510 |
| **මුළු වත්කම්** | | 1,326,782,393 | 5,842,160,715 | **7,168,943,107** | 9,944,937,649 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | | | |
| සමුච්චිත අරමුදල | **11** | 1,078,401,750 | 4,834,516,767 | **5,912,918,517** | 8,497,449,707 |
| | | 1,078,401,750 | 4,834,516,767 | **5,912,918,517** | 8,497,449,707 |
| **තාක්ෂණ සංචිත** | | | | | |
| නොඉපයූ වාරික | **12** | - | 1,059,398,308 | **1,059,398,308** | 963,443,837 |
| විලම්බිත කොමිස් | **13** | - | (176,532,688) | **(176,532,688)** | (161,486,715) |
| | | - | 882,865,620 | **882,865,620** | 801,957,122 |
| **වගකීම්** | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| රජයේ ප්‍රදාන | | 66,960 | - | **66,960** | 142,150 |
| ගෙවිය යුතු ලාභ කොමිස් | **14** | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| | | 66,960 | 12,287,375 | **12,354,336** | 12,429,525 |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු හිමිකම් | **15** | 206,295,040 | 79,783,010 | **286,078,050** | 392,410,772 |
| අනෙක් ගෙවිය යුතු දෑ | **16** | 42,018,643 | 32,707,942 | **74,726,585** | 240,690,522 |
| | | 248,313,682 | 112,490,953 | **360,804,635** | 633,101,294 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | 1,326,782,393 | 5,842,160,715 | **7,168,943,107** | 9,944,937,649 |

අරමුදලේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිනුම්කරන ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමි

.................................

මූල්‍ය කළමණාකරු

මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

මණ්ඩලය වෙනුවෙන් අත්සන් කලේ 1. .................................

2. .................................

# සමුච්චිත අරමුදලේ වෙනස්කම් පිලිබඳ ප්‍රකාශය

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| දෙසැ 31 න් අවසන් වසර සඳහා | 2012 අග්‍රහාර හා අනෙක් | 2012 SRCC & T අරමුදල | 2012 එකතුව | 2011 |
|---|---|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | | | |
| සමුච්චිත අරමුදල | 1,713,638,127 | 6,783,811,581 | **8,497,449,708** | 9,695,467,155 |
| අඩුකළා පෙර වසරේ ගැලපීම් | (243,245,409) | (200,301,466) | **(443,546,875)** | (17,717,155) |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | | (4,200,000,000) | **(4,200,000,000)** | (3,495,000,000) |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ කපා හැරීම් | (174,321,548) | | **(174,321,548)** | |
| එකතු කළා ප්‍රතිරක්ෂණ වියදම් කපා හැරීම් | | 150,314,066 | **150,314,066** | |
| වියදම් මත ආදායම් | (217,669,420) | 2,300,692,586 | **2,083,023,166** | 2,314,699,707 |
| | 1,078,401,750 | 4,834,516,767 | **5,912,918,517** | 8,497,449,707 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

*දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා*

| | 2012 | 2011 |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ*** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | **2,083,023,166** | 2,314,699,707 |
| අඩු කලා පෙර වසරේ ගැලපුම් බදු | **(443,546,875)** | (17,717,155) |
| අඩුකලා ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | **(4,200,000,000)** | (3,495,000,000) |
| අඩු කලා. පෙර වසරේ ගැලපුම්- භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ කපා හැරීී | **(174,321,548)** | |
| එකතු කළා පෙර වසරේ ගැලපුම්- ප්‍රතිරක්ෂණ | **150,314,066** | |
| | **(2,584,531,191)** | (1,198,017,448) |
| ***ගැලපුම්*** | | |
| ක්ෂය | **10,820,514** | 12,182,858 |
| PPE අලෙවිය මත පාඩු | **1,731,806** | - |
| ආයෝජන ආදායම් | **(615,813,544)** | (723,412,241) |
| නොඉපයූ වාරික ආදායම් | **95,954,471** | 141,879,032 |
| විලම්භිත කොමිස් | **(15,045,973)** | (21,741,415) |
| ***කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය*** | **(3,106,883,918)** | (1,789,109,214) |
| ලැබිය යුතු දෑ අඩුවීම/වැඩිවීම | **263,166,729** | 18,001,331 |
| ගෙවිය යුතු හිමිකම්හි අඩුවීම | **(106,332,722)** | (125,589,435) |
| රජයේ ප්‍රදාන අඩුවීම | **(75,190)** | (142,180) |
| අනෙක් ගෙවිය යුතු දෑ වැඩි වීම | **(165,963,938)** | (1,574,828) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල්** | **(3,116,089,038)** | (1,898,414,326) |
| ***ආයෝජනයන්ගෙන් මුදල් ප්‍රවාහ*** | | |
| දේපල පිරියත් හා උපකරණ මිලට ගැනීම් | **(8,154,600)** | (5,693,724) |
| වත්කම් අපහරණ | **469,956** | |
| භාණ්ඩාගාර ආයෝජන තල්පිරීම් | **(931,368,410)** | 1,129,561,201 |
| ආයෝජන ආදායම | **615,813,544** | 723,412,241 |
| **ආයෝජන කටයුතු වෙනුවෙන් භාවිතා කළ ශුද්ධ මුදල්** | **(323,239,510)** | 1,847,279,718 |
| **මුදල් හා මුදල් සමාන දෑහි අඩුවීම /වැඩිවීම** | **(3,439,328,548)** | (51,134,608) |
| **කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | **3,542,969,945** | 3,594,104,553 |
| **කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **103,641,397** | 3,542,969,945 |
| ***මුදල් හා මුදල් සමාන දෑ පිලබඳ විග්‍රහය*** | | |
| අතැති මුදල් හා බැංකු ශේෂය | **103,641,397** | 303,644,906 |
| කෙටිකාලීන ආයෝජන | - | 3,239,325,039 |
| මුදල් හා මුදල් සමාන දෑ | **103,641,397** | 3,542,969,945 |

# ගිණුම්කරන ප්‍රතිපත්ති

## 1.0 සමායතනික තොරතුරු

ජාතික රක්ෂණ භාර අරමුදල ('අරමුදල') "2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතින්" සංස්ථාගත කරන ලදුව, ශ්‍රී ලංකාව තුළ නිත්‍ය වශයෙන් පිහිටුවනු ලැබ ඇත. සමාගමේ ලේඛනගත කාර්යාලය කොළඹ 10, මරදාන පාර අංක 97 දරන ස්ථානයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද මෙකී ලිපිනයෙහි පිහිටා තිබේ.

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබනුයේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවක් මේ ගිණුම්වලට ඇතුළත් කෙරී නොමැත.

අදාළ විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කරනු ලැබ ඇත.

### 2.2 තුලනාත්මක අගයන්

අරමුදල විසින් දිගටම අදාළ කෙරුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයන්හි භාවිත කෙරුණු පිළිවෙත් වලට අනුකූල වේ. අවශ්‍ය තන්හි දී ඉකුත් වර්ෂයේ අගයන් යළි පෙළගස්වා මේ වර්ෂයේ ඉදිරිපත් කිරීමට ඇතුළත් කෙරී ඇත.

### 2.3 ප්‍රාග්ධන බැඳීම

ශේෂ පත්‍රයෙහි දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබිණි.

# ගිණුම්කරන ප්‍රතිපත්ති

## 2.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහන ප්‍රකාශය පිළියෙළ කරනු ලැබ ඇත්තේ "අනියම් ක්‍රමවේදයක්" භාවිතයෙනි.

## 2.5 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු කිසිවක් නොතිබිණි.

## 2.6 පශ්චාත් ශේෂ පත්‍ර කාර්යදාම

සියලුම පශ්චාත් ශේෂපත්‍ර කාර්යදාමයන් සැලකිල්ලට භාජනය කරන ලදුව අදාළ තන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ඒ ඒ සටහන්වල ගැළපීම් හෝ කරුණු අනාවරණය කිරීම් ඇතුළත් කරනු ලැබ තිබේ.

## 2.7 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

### 2.7.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ඒවායෙහි පිරිවැය අනුව සටහන් ගත කොට තිබේ.

දේපළ, පිරියත සහ උපකරණ යනු එකී වත්කම්, එහි අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරී තත්ත්වයන්ට පමුණුවාලීමේදී වැයවුණු කිසියම් වියහියදම් සමඟ ඒවායෙහි ගැනුම් මිල වෙයි.

අරමුදල පවත්වාගෙන යාම සඳහා තිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම දීර්ඝ කරලීම හෝ වැඩි දියුණු කරලීම සඳහා වැය වූ වියහියදම්.

**ක්ෂයවීම්**

සියලුම දේපළ, පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ ඒවායෙහි ගණන් බලා ඇති, ප්‍රයෝජනවත් ජීවිත කාලයට වැඩි ප්‍රමාණය පහත සදහන් පරිදි සමාන වාර්ෂික කොටස් මුදල් වලින් කපාහරිනු පිණිස ඒවායෙහි වටිනාකම මත සෘජු රේඛා පදනම යොදා ගනිමිනි.

| | |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | - අවුරුදු 10කට වැඩි |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - අවුරුදු 08කට වැඩි |
| කාර්යාල උපකරණ | - අවුරුදු 06කට වැඩි |
| පරිගණක | - අවුරුදු 05කට වැඩි |
| මෝටර් වාහන | - අවුරුදු 05කට වැඩි |

# ගිණුම්කරන ප්‍රතිපත්ති

**2.7.2 ආයෝජන**

පිරිවැය අනුව ආයෝජන දක්වා ඇත.

**2.7.2 ලැබිය යුතු දෑ**

වාරික පොළිය සහ අනෙකුත් ලැබිය යුතු දෑ එකතු කර ගැනීමට ඇති හැකියාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම් මත සමාලෝචනය කරනු ලැබේ.

ණය ගැතියන් සහ එකතු කර ගැනීමට අපහසු ලෙස හඳුනාගෙන ඇති අනෙකුත් ලැබිය යුතු දෑ කපාහරිනු ලැබේ.

2.7.3 **මුදල් හා මුදල් සමකයන්**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යය සඳහා මුදල් සහ මුදල් සමකයන් අතැති මුදල් සහ ශුද්ධ නොගෙවූ බැංකු අයිරා සම්බන්ධයන් වූ බැංකු තැන්පතුවලින් සංයුක්ත වේ.

**2.8 බැරකම් හා ප්‍රතිපාදන**

**2.8.1 නොඉපයූ වාරික**

නොඉපයූ වාරික යනු ශේෂ පත්‍රයෙහි දිනට පසුව යෙදුණු අවදානම් කාල පරිච්ඡේදයට අදාළ වන වර්ෂයක් තුළ දී ලිඛිත වාරිකවල සමානුපාතයන් මේ නොඉපයූ වාරික දළ වාරිකයෙහි 24 වැනි පදනම මත ගණනය කෙරේ.

**2.8.2 විලම්බිත කොමිස් මුදල**

විලම්බිත කොමිස් මුදලෙන් පෙන්නුම් කෙරෙනුයේ නොඉපයූ වාරිකයට අදාළ ශුද්ධ කොමිස් මුදලය.

2.8.3 **ලාභ කොමිස් මුදල**

ලාභ කොමිස් මුදල ගණනය කොට වාරික දෙකකින් ගෙවනු ලැබේ. පළමු වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී සය මසකින් සහ දෙවැනි වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී දොළොස් මසකින් ගෙවනු ලැබේ.

**2.8.4 ගෙවීමට ඇති හිමිකම්පෑම**

හිමිකම්පෑම් අදාළ මුදල් වර්ෂය තුළ දී නොගෙවන අනුමත හිමිකම්පෑම් වලින් ද අරමුදලෙහි සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කෙරෙන ගෙවීමට ඉතිරිව ඇති හිමිකම්පෑම් සඳහා කෙරෙන ප්‍රතිපාදනවලින් සහ ප්‍රතිරක්ෂණය සහ ගොඩගැනුම් අයකර ගැනීම් වෙතොත් ඒ සඳහා අදාළ වියදම් හා ඒ වෙනුවෙන් කෙරෙන ප්‍රතිපාදනවලින් ද සංයුක්ත වේ.

# ගිණුම්කරන ප්‍රතිපත්ති

### 2.8.5 අනෙකුත් ගෙවිය යුතු දෑ

අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායෙහි පිරිවැයෙහි දක්වා ඇත.

### 2.8.6 වෙනත් ප්‍රතිපාදන

ශේෂ පත්‍රයෙහි දිනට හඳුනාගත් සියලුම ප්‍රතිපාදන සඳහා ගිණුම්වල පූර්ණ වශයෙන් ඉඩ සලසා ඇත.

## 2.9 ආදායම් හා වියදම්

### 2.9.1 ආදායම

ආර්ථික ප්‍රතිලාභ, අරමුදල කරා ගලා ඒමට ඉඩකඩ පැවැත්මේ සහ ආදායම විශ්වසනීය අයුරින් මුදාගත හැකිවීමේ ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙරාතුව මතු දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ උපමාන ද සපුරාලීම අනිවාර්ය වෙයි.

**(අ) වාරික දායකත්වය**

වාරික දායකත්වය ඒවා ගෙවීම් කළ යුතු කාලය එළඹීමේදී හඳුනාගනු ලැබේ.

**(ආ) පොලී ආදායම**

ඉදිරියේදී එකතුකර ගැනීම් සැකසහිත වෙතොත් මිස පොලිය උපචිතවීමේදී පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**වියදම් හඳුනාගැනීම**

අරමුදල පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙහි පවත්වාගෙන යාමේදී වැය වන සියලුම වියදම් ද අතිරික්තය ලබා ගැනීමේදී ආදායමට බැර කරනු ලැබ ඇත.

අවිනිශ්චිතතාවන්

මණ්ඩලයේ මතය අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට එරෙහිව දැනට පවත්නා නඩු කටයුතු වලින් වාර්තාකරණ ලද මූල්‍ය ප්‍රතිඵලයන්ට හා අරමුදලේ අනාගතමෙහෙයුම්වලට සැලකිය යුතු බලපෑමක් ඇති නොවේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

*දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා*

| | 2012<br>අග්‍රහාර හා අනෙක | 2012<br>SRCC&T අරමුදල | 2012<br>එකතුව | 2011 |
|---|---|---|---|---|
| **01. ශුද්ධ වාරික ආදායම්** | | | | |
| වාරික ආදායම්- මොටර් රථ | 206,595,378 | - | **206,595,378** | 215,199,457 |
| වාරික ආදායම්-ප්‍රතිරක්ෂණ | 463,610,216 | - | **463,610,216** | 198,551,912 |
| වාරික ආදායම්- පාර්ලිමේන්තු සභිකයන් | 10,000,000 | - | **10,000,000** | 10,000,000 |
| වාරික ආදායම් - විදේශ රැකියා | 54,577,250 | - | **54,577,250** | 208,799,952 |
| වාරික ආදායම් - සාර (ගිනි සමුද්‍ර හා විවිධ.) | 104,047,985 | - | **104,047,985** | 170,876,837 |
| දළ ලිඛිත වාරික-වැව සිඅකැකෝ හා ත්‍රස්‍ත්‍රියා | - | 2,281,210,354 | **2,281,210,354** | 2,006,556,886 |
| වාරික ආපසු ගෙවීම් | - | (34,291) | **(34,291)** | (26,080) |
| **දළ ලිඛිත වාරික** | 838,830,829 | 2,281,176,063 | **3,120,006,892** | 2,809,958,964 |
| ප්‍රතිරක්ෂණ වාරික | (1,304,600) | - | **(1,304,600)** | (179,367,937) |
| **ශුද්ධ ලිඛිත වාරික** | 837,526,229 | 2,281,176,063 | **3,118,702,292** | 2,630,591,027 |
| නොඉපයූ වාරික වෙනුවෙන් සංචිතවල ශුද්ධ වෙ: | - | (95,954,471) | **(95,954,471)** | (141,879,032) |
| | 837,526,229 | 2,185,221,592 | **3,022,747,821** | 2,488,711,994 |
| **02. අග්‍රහාර දායකත්වය** | | | | |
| සාමාජිකයන්ගෙන් දායකත්වය | 588,435,521 | - | **588,435,521** | 623,424,037 |
| භාණ්ඩාගාර දායකත්වය | 275,000,000 | - | **275,000,000** | 494,229,000 |
| | 863,435,521 | - | **863,435,521** | 1,117,653,037 |
| **03. ප්‍රතිලාභ පාඩු හා වියදම්** | | | | |
| ඇස් කණනාඩි- අග්‍රහාර | 180,838,820 | - | **180,838,820** | 180,748,334 |
| පුද් රෝහල් ගාස්තු- අග්‍රහාර | 494,808,873 | - | **494,808,873** | 592,182,669 |
| ළදරු උපත් -අග්‍රහාර | 58,082,627 | - | **58,082,627** | 106,577,025 |
| හදිසි අනතුරු අග්‍රහාර | 16,292,203 | - | **16,292,203** | 21,702,772 |
| වෛද්‍ය ගාස්තු අග්‍රහාර | 22,372,361 | - | **22,372,361** | 23,382,719 |
| හෘද රෝග අග්‍රහාර | 145,768,353 | - | **145,768,353** | 136,497,358 |
| පිළිකා - අග්‍රහාර | 10,672,258 | - | **10,672,258** | 11,265,221 |
| සාමාන්‍ය හා හදිසි අනතුරු මරණ-අග්‍රහාර | 126,466,333 | - | **126,466,333** | 162,837,751 |
| මෝටර් රථ හිමිකම් සඳහා වියදම් | 115,629,748 | - | **115,629,748** | 127,633,818 |
| විදෙස් රැකියා හිමිකම් වියදම් | 123,305,107 | - | **123,305,107** | 182,688,549 |
| ප්‍රතිරක්ෂණ හිමිකම් වියදම් | 308,239,012 | - | **308,239,012** | 58,145,812 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම් පාර්ලිමේන්තු සභිකයන් | 12,564,947 | - | **12,564,947** | 9,419,786 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම් සාමාන්‍ය රක්ෂණ | 281,564,461 | | **281,564,461** | 96,419,651 |
| ඉදිරිපත් වූ ශුද්ධ හිමිකම් | - | 37,076,159 | **37,076,159** | (141,693,868) |
| ශුද්ධ කොමිස් මුදල් | 1,653,694 | 346,135,796 | **347,789,490** | 311,679,100 |
| ලාභ මත කොමිස් | - | - | **-** | - |
| | 1,898,258,796 | 383,211,955 | **2,281,470,751** | 1,879,486,696 |
| **04. කාර්ය මණ්ඩල පිරිවැය** | | | | |
| දළ වැටුප | 49,562,281 | 1,588,197 | **51,150,478** | 38,783,551 |
| සේ අ අ - 12% | 5,873,244 | 176,436 | **6,049,680** | 5,701,461 |
| සේනිභා අ | 1,464,516 | 44,109 | **1,508,625** | 1,474,356 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 281,817 | - | **281,817** | 397,571 |
| වාර්ෂික ප්‍රසාද දීමනා හා දිරි දීමනා | 2,963,334 | - | **2,963,334** | 3,020,817 |
| අනෙක් දීමනා | 2,864,647 | 369,801 | **3,234,449** | 2,498,004 |
| අනියම් වැටුප් | 839,870 | - | **839,870** | 893,414 |
| කාර්යමණ්ඩල සුභසාධන වියදම් | 1,944,808 | - | **1,944,808** | 1,438,399 |
| කාර්ය මණ්ඩල පුහුණු | 1,978,059 | - | **1,978,059** | 789,575 |
| පාරිතෝෂික වියදම් | 2,055,589 | | **2,055,589** | 1,003,705 |
| | 69,828,165 | 2,178,544 | **72,006,709** | 56,000,854 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරිය.)

(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

| | 2012 අග්‍රහාර හා අනෙක් | 2012 SRCC&T අරමුදල | 2012 එකතුව | 2011 |
|---|---|---|---|---|
| **05. පරිපාලන වියදම්** | | | | |
| ගමන් | 537,305 | 2,599 | **539,904** | 317,532 |
| ක්ෂය වීම් | 7,532,513 | 3,288,001 | **10,820,514** | 12,281,608 |
| කුලී | 1,627,418 | 18,000,000 | **19,627,418** | 6,491,492 |
| ජල | 511,970 | - | **511,970** | 466,522 |
| විදුලි | 5,448,236 | - | **5,448,236** | 3,696,368 |
| දුරකථන | 1,504,472 | 14,446 | **1,518,917** | 1,550,725 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 3,907,422 | - | **3,907,422** | 5,284,550 |
| කාර්යාල අලුත්වැඩියා හා නඩත්තු | 8,838,871 | - | **8,838,871** | 6,707,712 |
| සනීපාරක්ෂක කටයුතු | 1,334,420 | - | **1,334,420** | 276,326 |
| පරීක්ෂාව හා තක්සේරුව | 2,335,017 | 1,578,688 | **3,913,705** | 3,497,251 |
| දැයට කිරුළ සඳහා වියදම් | 2,095,279 | - | **2,095,279** | 3,649,979 |
| පරිත්‍යාග | 298,730 | 150,000 | **448,730** | 7,846,862 |
| විනෝද කටයුතු | 19,844 | 264,063 | **283,907** | 245,461 |
| වෘත්තික ගාස්තු | 34,915 | - | **34,915** | 1,350,563 |
| රැස්වීම් සඳහා වියදම් | 684,966 | - | **684,966** | 548,189 |
| ඊ කාඩ් පත් මුද්‍රණය | 6,025,000 | - | **6,025,000** | 4,364,000 |
| 5වන සංවත්සරය | - | - | - | 724,083 |
| නෛතික වියදම් | 657,115 | 245,000 | **902,115** | 820,206 |
| උපදේශක ගාස්තු | 254,800 | - | **254,800** | 1,000,916 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් වියදම් | 934,317 | - | **934,317** | 759,809 |
| ඉන්ධන වියදම් | 466,321 | - | **466,321** | 468,467 |
| වාහන රක්ෂණ | 279,903 | 195,152 | **475,055** | 685,636 |
| වෛද්‍ය රක්ෂණ | 205,550 | 18,746 | **224,296** | 176,017 |
| පුවත්පත් හා වාර සඟරා | 59,283 | - | **59,283** | 68,681 |
| ශ්‍රී ලංරම වෙත ගාස්තු ගෙවීම් | - | - | - | 400,000 |
| ආරක්ෂක ගාස්තු | 1,148,408 | - | **1,148,408** | 1,558,056 |
| ශාඛා විවෘත කිරීමේ වියදම් | - | | - | - |
| තැපැල් | 2,931,895 | 10,330 | **2,942,225** | 2,508,497 |
| වාහන නඩත්තු | 563,653 | 397,835 | **961,489** | 1,170,044 |
| | 50,237,624 | 24,164,860 | **74,402,484** | 68,915,550 |
| **06. මූල්‍ය හා අනෙකුත් වියදම්** | | | | |
| බැංකු ගාස්තු | 105,237 | 78,616 | **183,853** | 535,221 |
| විගණන ගාස්තු | 158,160 | 180,000 | **338,160** | 115,650 |
| ජාතිය ගොඩ නැගීමේ බදු වියදම් | - | 12,923,461 | **12,923,461** | 14,584,151 |
| මුද්දර ගාස්තු | 37,861 | - | **37,861** | 273,650 |
| අපහරණ පාඩු | - | - | - | - |
| පාඩු / (ලැබීම්) විනිමය හුවමාරු අගයේ අනුපාතිඃ | 1,731,806 | - | **1,731,806** | |
| තාක්ෂණික උපදෙස් කමිටුවට සහභාගී වීමේ ගාස් | - | 199,500 | **199,500** | 117,000 |
| කාර්ය කමිටුවේ පැමිණීමේ ගාස්තු | - | 81,750 | **81,750** | 95,250 |
| කමිටු පැමිණීමේ ගාස්තු | - | - | - | - |
| විවිධ වියදම් | 356,820 | 128,265 | **485,085** | 572,804 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 90,653 | - | **90,653** | 323,883 |
| ප්‍රචාරක වියදම් | 1,186,145 | - | **1,186,145** | 4,964,316 |
| | 3,666,682 | 13,591,592 | **17,258,273** | **21,581,925** |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරිය.)

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

| | මෝටර් වාහන | කාර්යාල උපකරණ | ලී බඩු හා සවිකිරීම් | මෘදුකාංග | විවිධ වත්කම් | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| පරිව්‍යය | | | | | | |
| 2012/01/01 දිනට ශේෂව | 34,470,255 | 26,142,782 | 8,132,941 | 6,542,073 | 71,988 | 75,360,038 |
| පෙර වසරේ ගැලපුම් | | (351,658) | 351,658 | | | - |
| එකතු කිරීම් | - | 7,267,874 | 886,726 | - | - | 8,154,600 |
| අපහරණයන් | - | (2,130,703) | (2,932,997) | - | - | (5,063,700) |
| 2012/12/31 දිනට ශේෂය | **34,470,255** | **30,928,294** | **6,438,328** | **6,542,073** | **71,988** | **78,450,938** |
| ක්ෂය වීම් | | | | | | |
| 2012/01/01 දිනට ශේෂය | 23,035,725 | 12,560,594 | 3,959,227 | 6,174,277 | 23,338 | 45,753,161 |
| වසර සඳහා ගාස්තු | 5,731,803 | 4,053,446 | 758,464 | 274,242 | 2,559 | 10,820,514 |
| වසරේ අපහරණයන් | - | (1,213,465) | (1,648,474) | - | - | (2,861,939) |
| 2012/12/31 දිනට ශේෂය | **28,767,528** | **15,400,576** | **3,069,217** | **6,448,518** | **25,897** | **53,711,736** |
| | | | | | | - |
| 31/12/2012 දිනට ලියන ලද වටිනාකම් | **5,702,726** | **15,527,719** | **3,369,112** | **93,555** | **46,091** | **24,739,202** |

| | **2012** අග්‍රහාර හා අනෙක් | **2012** SRCC&T අරමුදල | **2012** එකතුව | 2011 එකතුව |
|---|---|---|---|---|
| **08.**ආයෝජන | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | - | 628,369,600 | **628,369,600** | 643,964,700 |
| භාණ්ඩාගාර බිල්පත් - REPO | 969,761,256 | 1,062,221,171 | **2,031,982,426** | 4,499,484,696 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 1,694,634,700 | **1,694,634,700** | 1,506,416,000 |
| ණයකර | - | 1,045,780,000 | **1,045,780,000** | 1,045,780,000 |
| | | | | 7,695,645,396 |
| අඩුකළා | | | | |
| හිලව් නොකල වට්ටම් | - | (26,380,841) | **(26,380,841)** | (31,352,432) |
| එකතු කළා | - | | | |
| හිලව් නොකල වාරික | - | 1,528,787 | **1,528,787** | 19,578,338 |
| | 969,761,256 | 4,406,153,417 | **5,375,914,672** | 7,683,871,302 |
| | | | | |
| **09.**ලැබිය යුතු | | | | |
| BFE වෙතින් ලැබිය යුතු වාරික | - | - | - | 19,032,832 |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු | - | - | - | 174,321,548 |
| ලැබිය යුතු වාරික- සාමාන්‍ය රක්ෂණ | 1,955,673 | - | **1,955,673** | 7,612,013 |
| ලැබිය යුතු පොලී | 33,634,546 | 115,676,102 | **149,310,648** | 158,040,419 |
| ලැබිය යුතු පොලී වැව සිර කැකෝ හා ත්‍රක්‍රි | - | 308,960,490 | **308,960,490** | 338,879,954 |
| ආර්ථික සේවා ගාස්තු | 11,078,483 | - | **11,078,483** | 21,169,387 |
| ප්‍රතිරක්ෂන අංශයෙන් ලැබිය යුතු | | 5,349,749 | **5,349,749** | 4,262,442 |
| ලැබිය යුතු අත්තිකාරම් | 481,841 | - | **481,841** | 6,789,116 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික | 180,811,195 | - | **180,811,195** | 110,153,464 |
| මෘදු ණය | - | 958,456,782 | **958,456,782** | 1,054,801,014 |
| WHT-ලැබිය යුතු | | 23,114,660 | **23,114,660** | 11,611,080 |
| ආපසු ගෙවන තැන්පතු | 800,688 | 9,000,000 | **9,800,688** | 9,974,103 |
| මෘදු ණය | 10,110,757 | 3,442,991 | **13,553,748** | 8,887,446 |
| පෙර ගෙවූ වියදම් | - | 5,092 | **5,092** | 5,929 |
| සාමාජිකයන්ගෙන් ආපසු ලැබිය යුතු චෙක්පත් | 1,768,785 | - | **1,768,785** | 2,273,818 |
| | 240,641,969 | 1,424,005,867 | **1,664,647,836** | 1,927,814,565 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් (ඉතිරිය.)

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

| *දෙසැම්බර් 31 දිනට* | 2012<br>අග්‍රහාර හා අනෙක් | 2012<br>SRCC&T<br>අරමුදල | 2012<br>එකතුව | 2011 |
|---|---|---|---|---|
| **10.මුදල් හා මුදල් සමාන දෑ** | | | | |
| බැංකුවේ මුදල් | 94,825,737 | 8,676,291 | **103,502,028** | 303,493,729 |
| අතැති මුදල් | 138,789 | 580 | **139,369** | 151,177 |
| | 94,964,525 | 8,676,871 | **103,641,397** | 3,542,969,945 |
| **11. සමුච්චිත අරමුදල** | | | | |
| සමුච්චිත අරමුදල | 1,713,638,127 | 6,783,811,581 | **8,497,449,708** | 9,695,467,155 |
| අඩුකලා පෙර වසරේ ගැලපුම් | (243,245,409) | (200,301,466) | **(443,546,875)** | (17,717,155) |
| ඒකාබද්ධ අරමුදලට දායකවීම් | | (4,200,000,000) | **(4,200,000,000)** | (3,495,000,000) |
| කපාහරින ලද භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | (174,321,548) | | **(174,321,548)** | - |
| එකතු කළා කපා හරින ලද ප්‍රතිරක්ෂණ වියදම් | - | 150,314,066 | **150,314,066** | - |
| අආදායම් මත වියදම් | (217,669,420) | 2,300,692,586 | **2,083,023,166** | 2,314,699,707 |
| | 1,078,401,750 | 4,834,516,767 | **5,912,918,517** | 8,497,449,707 |
| **12.නොඉපයූ වාරික** | | | | |
| වර්ෂාරම්භක ශේෂය | - | 963,443,837 | **963,443,837** | 821,564,804 |
| වසර සඳහා ප්‍රතිපාදන | - | 95,954,471 | **95,954,471** | 141,879,032 |
| වර්ෂාවසාන ශේෂය | - | 1,059,398,308 | **1,059,398,308** | 963,443,837 |
| **13.විලම්භිත කොමිස්** | | | | |
| වර්ෂාරම්භක ශේෂය | - | 161,486,715 | **161,486,715** | 139,745,300 |
| වසර සඳහා ප්‍රතිපාදන | - | 15,045,973 | **15,045,973** | 21,741,415 |
| වර්ෂාවසාන ශේෂය | - | 176,532,688 | **176,532,688** | 161,486,715 |
| **14.ගෙවිය යුතු ලාභ මත කොමිස්** | | | | |
| ගෙවිය යුතු ලාභ මත කොමිස් | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| **15. ගෙවිය යුතු හිමිකම්** | | | | |
| ගෙවිය යුතු හිමිකම් අග්‍රහාර | 85,932,811 | - | **85,932,811** | 150,971,896 |
| ගෙවිය යුතු හිමිකම් වැඩසිරකැකෝ හා ත්‍රස්තවාදය | - | 79,783,010 | **79,783,010** | 231,968,907 |
| ගෙවිය යුතු හිමිකම්- ප්‍රතිරක්ෂණ | 113,798,695 | - | **113,798,695** | - |
| ගෙවිය යුතු හිමිකම්- මෝටර් වාහන රක්ෂණ | 4,326,944 | | **4,326,944** | 9,452,672 |
| ගෙවිය යුතු හිමිකම් -සාමාන්‍ය රක්ෂණ | 2,236,590 | - | **2,236,590** | 17,297 |
| | 206,295,040 | 79,783,010 | **286,078,050** | 392,410,772 |
| **16.ගෙවිය යුතු අනෙකුත්දෑ** | | | | |
| උපචිත වියදම් | 11,020,220 | 1,413 | **11,021,633** | 7,683,966 |
| ගෙවිය යුතු අනෙක් දෑ | 1,031,527 | 242,955 | **1,274,482** | 1,117,051 |
| ලෙවිය යුතු වැඩසිරකැකෝ හා ත්‍රස්තවාදය | 8,075,322 | - | **8,075,322** | 4,791,126 |
| ගෙවිය යුතු පාරිතෝෂික | 2,897,037 | - | **2,897,037** | 1,003,705 |
| ගෙවිය යුතු මාර්ග ආරක්ෂණ බදු | 527,485 | - | **527,485** | 534,523 |
| ආපසු ගෙවිය යුතු වාරික | - | 11,844,581 | **11,844,581** | 11,810,290 |
| සුභසාධන සමාජයට ගෙවිය යුතු දායක මුදල් | 39,847 | - | **39,847** | 54,477 |
| ආපසු එවන ලද ගෙවිය යුතුහිමිකම් චෙක්පත් /SLIF | 2,801,352 | - | **2,801,352** | 2,733,700 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | - | 460,000 | **460,000** | 280,000 |
| ගෙවිය යුතු වැට් සහ ජාතිගොඩනැගීමේ බදු | 15,625,852 | 20,158,993 | **35,784,845** | 60,367,618 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | - | - | **-** | 150,314,066 |
| | 42,018,643 | 32,707,942 | **74,726,585** | 240,690,522 |

# 10. විගණන වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. එෆ්පී/අයි/එන්අයිටීඑෆ්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 පෙබරවාරි 15 දින

සභාපති
ජාතික රක්ෂණ භාර අරමුදල

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ සටහන්වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2014 අගෝස්තු 22 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

AGDSL Auditor General's Department

2

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මාසික කුළිය රු.250,333 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලට (S.R.C.C&TF) අදාළ වූ රු. 23,060 ක් වටිනා තොග, ජාතික රක්ෂණ භාර අරමුදලේ වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ (S.R.C.C& TF ) සහ අග්‍රහාර හා වෙනත් (NITF) අංශයේ සෘජු වියදම්, වක්‍ර වියදම් සහ පොදු කාර්ය වියදම් සාධාරණ පදනමක් මත විභජනය කර මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වුවත් එසේ නොකළ අවස්ථාන් පහත දැක්වේ .

(i) කාර්යාල ගොඩනැගිල්ල සඳහා රු.19,627,418 ක් වාර්ෂික කුළී මුදලින් සියයට 91.7ක් හෙවත් රු.18,000,000 ක් වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ (S.R.C.C& TF) වියදම් ලෙස දක්වා තිබුණි. එහෙත් කාර්යය මණ්ඩලය සඳහා භාවිතා කරණු ලැබුවේ මහල් පහකින් සමන්විත කාර්යාල ගොඩනැගිල්ලෙන් සියයට 10 කටත් අඩු ප්‍රමාණයකි.

(ii) එකතුව රු.12,923,461 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු වියදම සම්පූර්ණයෙන්ම වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ (S.R.C.C& TF) වියදමක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(iii) එකතුව රු.7,278,799 ක් වූ සේවක වියදම් අග්‍රහාර අංශයේ සහ වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල(S.R.C.C& TF) යන අංශ දෙකට බෙදා වෙන් කළ හැකි වුවත් එසේ නොකර එම මුළු වියදමට අග්‍රහාර අංශයේ වියදම් ලෙස දක්වා තිබුණි.

(iv) තවද, පොදුවේ දරන ලද රු. 28,598,307 ක වියදම් සුදුසු පදනමක් මත ඉහත සඳහන් අංශ දෙක සඳහා විභජනය නොකර මුළු වියදමට අග්‍රහාර අංශයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(v) අග්‍රහාර අංශය සහ වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල(S.R.C.C& TF) යන අංශ දෙක යටතේ පිළිවෙලින් රු. 1,977,405 ක් සහ රු.1,432,050 ක් වියදම් ලෙස දක්වා තිබුණද එම වියදම් අදාල අංශ දෙක අතර විභජනය කළ පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

බැංකු ගිණුමක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.7,215,904 ක්ව තිබියදී ,එදිනට මුදල් පොතේ ශේෂය රු.1,251,008 ලෙස සලකා බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කර තිබුණි. ඒ අනුව බැංකු ගිණුමේ හා බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන ශේෂ එකිනෙක නොගැලපුණි. කෙසේ වුවද, මේ සම්බන්ධව වැඩිදුර විමසීමේදී අරමුදලේ සභාපතිවරයා විසින් ,2012 හා ඉන් පෙර වර්ෂයන්හි පරිගණක පද්ධතියේ පවත්නා දෝෂ හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇති බවත් 2013 වර්ෂයේදී එය නිවැරදි කර ඇති බව තහවුරු කරන බවත් විගණනයට දන්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම<br>රු. මිලියන | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) ආයතනයකට සහන ණය යටතේ ලබා දී ඇති අතිරේක ණය | 56.78 | (i) ණය ගිවිසුම<br>(ii) අනුමැතිය |
| (ආ) ජාතික රක්ෂණ භාර අරමුදලේ බැංකු ගිණුම් ශේෂයක් | 1.11 | ශේෂ සනාථ කිරීම |
| (ඇ) ක්ෂය වියදම | | |
| - අග්‍රහාර අංශය | 7.53 | ක්ෂය ගණනය කිරීම් විස්තර |
| - වැඩ වර්ජන , කැරලි කෝලහල , සිවිල් අරගල සහ ත්‍රස්තවාදි අරමුදල | 3.29 | |

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය- 2006 | |
| (i) 4.3.1 සහ 4.3.2 ඡේද | කාර්යාල කාමර බෙදා වෙන් කිරීමේ රු.6,645,584 ක කොන්ත්‍රාත්තුව සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබූ අතර පිරිවැය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුත්තේ කුමන මට්ටමින්ද යන්න පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 5.2.1 ඡේදය | කොන්ත්‍රාත්තුව සම්බන්ධ ලංසුවක වලංගු හා ප්‍රතිචාරාත්මකභාවය පිළිගනු ලැබීමට අවශ්‍ය වන කොන්දේසි ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව සඳහන් කර නොතිබුණි. |
| (iii) | 5.6. ඡේදය | කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පිරිවිතර සහ ප්‍රමාණ පත්‍ර සකස් කර නොතිබුණි. |
| (ආ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය රහිතව අරමුදලේ සේවකයින්ට සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ප්‍රසාද දීමනා හා දිරි දීමනා රු.2,963,334 ක් සහ වෙනත් දීමනා ලෙස රු.3,234,449 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වගන්තිය සහ 2012 දෙසැම්බර් 28 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 157 හි 4 වගන්තිය | නිලධාරියාගේ මාස දහයක මූලික වැටුප හෝ රු.250,000 ක් හෝ යන දෙකෙන් අඩු මුදල ආපදා ණය උපරිම ලෙස වශයෙන් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව නිලධාරීන් හත්දෙනෙකුට එම සීමාව ඉක්මවා ආපදා ණය ලෙස එකතුව රු.635,000 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7 පරිච්ඡේදය | 2014 ජූලි 21 දින වන විටත් පරිපාලන අත්පොත පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරු අනුමත කරවා ගැනීමකින් තොරව හෝ භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ශාඛා කාර්යාල දෙකක ශාඛා කළමනාකරුවන් ලෙස සේවයේ යොදවා ගත් නිලධාරීන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී මසකට රු. 30,000 බැගින් රු. 720,000 ක් ගෙවීම කර තිබුණි.

(ආ) 1996 හා 1997 වසරවල කොළඹ කොටුව ආශ්‍රිතව සිදු වූ ත්‍රස්තවාදී බෝම්බ පිපිරීම්වලින් හානියට පත් වූ වාණිජ ආයතන නඟා සිටුවීම සඳහා සහනදායි කොන්දේසි යටතේ ණය ලබාදිය යුතු වාණිජ ආයතන හා ලබාදිය යුතු ණය ප්‍රමාණය පිළිබඳවද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් කර තිබියදී එහි සඳහන් නොවූ වාණිජ ආයතන 05 ක් වෙත රු.මිලියන 355.1 ක ණය ලබාදී තිබූ අතර එම ණය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල හෝ මහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,083,023,167 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,314,699,707 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.231,676,540 ක අඩුවීමට ආයෝජන ආදායම් හා ණය පොළී ආදායම් අඩුවීම සහ රක්ෂණ වන්දි හා ප්‍රතිලාභ ගෙවීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි .

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය පිහිටුවීම සඳහා හම්බන්තොට නගර සභාව පරණ පුස්තකාලය ගොඩනැගිල්ල කුළියට ලබා ගෙන තිබුණ ද, මෙ සම්බන්ධයෙන් නගර සභාව සහ අරමුදල අතර ගිවිසුමකට හෝ එළඹ නොතිබුණි. අරමුදල විසින් ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් රු.1,489,269 ක් වියදම් කර තිබුණ ද, ගොඩනැගිල්ල ලබාගෙන මාස 8 ක් වැනි කෙටි කාල සීමාවකින් පසුව ගොඩනැගිල්ලෙන් ඉවත්ව තිබීම නිසා එය ඵලදායී වී නොතිබුණි.

(ආ) වර්ග අඩි 500 ක ඉඩ ප්‍රමාණයක් මෙම ප්‍රාදේශීය කාර්යාලය සඳහා අවශ්‍ය බව සඳහන් කර තිබුණද, 2011 වර්ෂයේ අවසානයේදී අඩි ධාරිතාවයකින් යුත් වර්ග අඩි 1472 ක් සහිත රුහුණු පරිපාලන සංකීර්ණයට කාර්යාලය ගෙන ගොස් තිබුණු බැවින් වර්ග අඩි 972 ක ඉඩකඩ ප්‍රමාණයක් සඳහා රු.991,440 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුරාධපුර ශාඛා කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුළියට ලබා ගැනීමට මිල ගණන් කැඳවා තිබුණු අතර අවම මිල ගණන් ඉදිරිපත්කර තිබූ වටිනාකම රු.16,000 ක ගොඩනැගිල්ල නොසලකා ඊට වඩා වැඩි කුළියක් වූ ගොඩනැගිල්ලක් තක්සේරු කිරීම සඳහා රු.11,540 ක වියදමක් දරා තිබුණි. කෙසේ වුවද, අවම කුලිය සහිත ගොඩනැගිල්ල හෝ තක්සේරු කළ ගොඩනැගිල්ල නොසලකා රු.25,000 ක මාසික කුළියක් යටතේ වෙනත් ගොඩනැගිල්ලක් කුළී පදනම මත ලබා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී පිරිවැය හා ශුද්ධ අගය පිළිවෙළින් රු.5,063,700 ක් හා රු.2,201,761 ක් වූ ස්ථාවර වත්කම් වර්තමාන වෙළඳපල වටිනාකම් සමඟ සසඳා හෝ තක්සේරු කිරීමකින් තොරව රු.500,000 කට අලෙවි කර තිබුණි.

4.3 හඳුනාගත් පාඩු

----------------

2011 නොවැම්බර් මාසයට අදාල රු.113,774 ක් සේවා නියුක්ති භාර අරමුදලේ දායක මුදල නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.5,689 ක් වූ අධිභාර මුදලක් ගෙවා තිබුණි.

4.4 ආර්ථික නොවූ ගණුදෙනු

-------------------------

අරමුදලෙහි පුරප්පාඩු තනතුරු 8 ක් සඳහා නිලධාරින් බඳවා ගැනීමට 2012 ජනවාරි මාසයේදී පුවත්පත් දැන්වීම් පල කිරීමේදී ත්‍රෛභාෂා ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු නොකර ඩේලි නිව්ස් පුවත්පතෙහි පමණක් දැන්වීමක් පල කර තිබුණද, එම දැන්වීම ප්‍රකාරව අදාළ නිලධාරින් බඳවා ගෙන නොතිබුණු බැවින් දැන්වීම පල කිරීම සඳහා ගෙවන ලද රු.70,200 ආනාර්ථික ගනුදෙනුවක් විය.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාන්‍යාධිකාරි සහ සහකාර සාමාන්‍යාධිකාරි තනතුරු අනුමත කළ දින සිට 2014 නොවැම්බර් 14 දක්වාම එම තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) අනුමත කළමනාකරු තනතුරු නවයක් සහ සහකාර කළමනාකරු තනතුරු දහතරක් පැවතියද කළමනාකරු තනතුරු හතක් සහ සහකාර කළමණාකරු තනතුරු තුනක් සඳහා බඳවා ගැනීම් සිදු කර නොතිබුණි.

(ii) අනුමැතියකින් තොරව තනතුරු හයක් සඳහා නිලධාරීන් නවයක් බඳවා ගෙන තිබුණි.

(iii) අනුමත තාක්ෂණ සහකාර, දුරකථන ක්‍රියාකරු සහ පිළිගැනීමේ නිලධාරී සහ කම්කරු තනතුරු තුනක් සඳහා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ස්ථිර පදනම මත බඳවා ගැනීමට අනුමත කර තිබූ කළමනාකරණ සහකාර, රියදුරු සහ කාර්යාල සහායක තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 42 ක් බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය සඳහා කළමණාකරුවෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department



6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති පාලනය
(ඇ) ප්‍රසම්පාදන කටයුතු
(ඈ) මානව සම්පත් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# 11. සත් වසරක ප්‍රගතිය

# සත් වසරක සාරාංශය - මූල්‍ය කාර්යසාධනය

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින්)*

| *දෙසැ 31 න් අවසන් වසර සඳහා* | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | | |
| ඉපයූ ශුද්ධ වාරික ආදායම | 3,886,183,342 | 3,606,365,031 | 3,926,469,856 | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ හාණි හා වියදම්** | | | | | | | |
| රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ | (2,281,470,751) | (1,879,486,696) | (2,292,072,983) | (2,075,936,806) | (1,736,355,732) | (1,423,044,038) | (242,465,993) |
| | 1,604,712,590 | 1,726,878,335 | 1,634,396,873 | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **අනෙකුත් ආදායම්** | | | | | | | |
| අආයෝජන ආදායම් | 615,813,544 | 723,412,241 | 798,117,037 | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මෘදුණය සඳහා පොලී | 7,278,316 | 10,163,846 | 16,982,331 | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| අනෙක් ආදායම් | 18,886,182 | 743,614 | 1,006,353 | 471,787 | 917,841 | | |
| | 641,978,043 | 734,319,701 | 816,105,721 | 1,380,055,889 | 1,225,806,111 | 1,798,837,006 | 76,436,649 |
| **වියදම්** | | | | | | | |
| කාර්ය මණ්ඩලාශ්‍රිත පිරිවැය | 72,006,709 | 56,000,854 | 42,326,032 | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන වියදම් | 74,402,484 | 68,915,550 | 45,136,006 | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය හා අනෙකුත් වියවම් | 17,258,273 | 21,581,925 | 32,425,697 | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **මුළු වියදම්** | 163,667,466 | 146,498,329 | 119,887,735 | 120,772,099 | 55,114,528 | 29,029,109 | 2,980,916 |
| බදු | | 108,349,446 | | | | | |
| **වියදම මත ආදායම** | 2,083,023,166 | 2,206,350,261 | 2,330,614,859 | 3,202,833,203 | 2,862,286,514 | 1,769,807,897 | 73,455,733 |

සටහන : ඉපයූ ශුද්ධ වාර්ෂික ආදායම අගයන් ගණනය කිරීමේදී මෙහිදී අග්‍රහාර දායකත්වය ඇතුළත් කර ඇත.

# සත් වසරක සාරාංශය - මූල්‍ය තත්වය

*(සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

| *දෙසැ 31 න් අවසන් වසර සඳහා* | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 24,739,202 | 29,606,877 | 36,096,011 | 43,603,504 | 44,659,781 | 25,240,465 | 1,461,388 |
| ආයෝජන | 5,375,914,672 | 4,444,546,262 | 5,574,107,464 | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 | |
| | 5,400,653,874 | 4,474,153,140 | 5,610,203,475 | 8,593,810,225 | 7,793,838,397 | 5,474,583,705 | 1,461,388 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| ලැබිය යුතු දෑ | 1,664,647,836 | 1,927,814,565 | 1,945,815,895 | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 | 511,844,970 |
| මුදල් හා මුදල් සමාන දෑ | 103,641,397 | 3,542,969,945 | 3,594,104,553 | 110,173,003 | 239,795,258 | 560,259,122 | 13,357,202 |
| | 1,768,289,233 | 5,470,784,510 | 5,539,920,448 | 2,189,743,421 | 2,228,297,246 | 2,782,214,948 | 525,202,172 |
| **මුළු වත්කම්** | 7,168,943,107 | 9,944,937,649 | 11,150.123,923 | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |
| **ව්‍යාපාර වස්තු, වගකීම්** | | | | | | | |
| **ව්‍යාපාර වස්තු** | | | | | | | |
| සමුච්චිත අරමුදල | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| **තාක්ෂණික සංචිත** | | | | | | | |
| නොඉපයූ වාරික | 1,059,398,308 | 963,443,837 | 821,564,804 | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 | |
| විලම්භනය කරන ලද කොමිස් | (176,532,688) | (161,486,715) | (139,745,300) | (200,139,536) | (206,999,340) | (161,317,228) | |
| | 882,865,620 | 801,957,122 | 681,819,505 | 846,685,740 | 856,318,432 | 716,378,499 | |
| **වගකීම්** | | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| රජයේ ප්‍රදාන | 66,960 | 142,150 | 284,330 | 719,190 | 719,190 | 719,190 | 719,190 |
| ගෙවිය යුතු ලාභ මත කොමිස් | 12,287,375 | 12,287,375 | 12,287,375 | 63,762,150 | 113,635,474 | 83,722,067 | |
| | 12,354,336 | 12,429,525 | 12,571,705 | 64,481,340 | 114,354,664 | 84,441,257 | 719,190 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| ගෙවිය යුතු හිමිකම් | 286,078,050 | 392,410,772 | 518,000,207 | 329,499,921 | 333,321,632 | 602,777,397 | |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 74,726,585 | 240,690,522 | 242,265,350 | 178,033,863 | 306,121,335 | 269,692,571 | 431,842,361 |
| | 360,804,635 | 633,101,294 | 760,265,557 | 507,533,784 | 639,442,967 | 872,469,968 | 431,842,361 |
| **මුළු ව්‍යාපාර වස්තු හා වගකීම්** | 7,168,943,108 | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,647 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |

# 12. සමායතනික තොරතුරු

❖ **ආයතනයේ නම :**

ජාතික රක්ෂණ භාර අරමුදල

❖ **නෛතික ආකෘතිය :**

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

❖ **ලේඛනගත කාර්යාලය :**

ජාතික රක්ෂණ භාර අරමුදල

අංක 97, මරදාන පාර,

කොළඹ - 10.

❖ **විගණකවරු :**

විගණකාධිපති

❖ **බැංකුකරුවෝ**

මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව